# සැදෑව

சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2015 මාර්තු/ අප්‍රේල්



වෙබ් අඩවිය ඃ www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com

අංක ඃ QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.





## My Favorite Things

Many of you may have seen the film "The Sound of Music" and may remember the song "My Favorite Things" sung by Julie Andrews. Recently at a concert to celebrate her 79th Birthday, Julie Andrews sang a parody of the song which had the audience in fits of laughter. The parody will of course have a lot of relevance to senior citizens and old age pensioners. (I have changed a few words)

Botox and eyedrops and needles for knitting
Walkers and handrails and new dental fittings
Central Bank pension slips tied up in strings
These are a few of my favorite things.
Arthritis and cataracts, hearing aids and glasses
Polident and Fixodent and False Teeth in glasses
Pacemakers, wheel chairs and crutches with swings
These are a few of my favorite things.
When my "pipes" leak, when my knees go bad
I simply remember my favorite things
And then I don't feel so old.
Hot tea and crumpets and com pads for bunions
No hot spicy food or food cooked with onions
Bath robes and heating pads, my medicines they bring
These are a few of my favorite things.
Back pain, confused brains and no time for sinning
Brittle bones and fractures and hair that is thinning
And we just won't mention our short shrunken frames
When we remember our favorite things.
When the joints ache when the hips break
When the eyes grow dim
We only remember the great times we've had
And then we don't feel so bad!!


## Nelson Mandela

Nelson Mandela the former President of South Africa was one of the inspiring figures of this century. As head of the African National Congress he led the fight against the policy of apartheid. He spent twenty eight years in the notorious Robin Island Prison. In his autobiography "Long Walk to Freedom" he states that through those long years of imprisonment he found solace in the bible and in Shakespeare. But there was one poem which was a source of great strength to him. This poem Invictus - is set out below. I am sure many who read it will find the words of this poem inspiring.

**Invictus** I

Out of the night that covers me
Black as the pit from pole to pole
I thank whatever gods may be
For my unconquerable soul
In the fell clutch of circumstance
I have not winced or cried out loud
Under the bludgeonings of chance
My head is bloody but unbowed.
It matters not how strait the gate
How charged with punishment the scroll
I am the master of my fate
I am the captain of my soul!

**- William Ernest Henry**



**Sent By: Terrence**
Savundranayagamtsavun@sltnet.lk

# ගෙවුන තෙදින චාරිකාවට පසු පිවිසුමක්

**සෑ**මදාම සඳහන් කළා වගේ, සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී මූල ධර්මයන්ට අනුව අප මහ බැංකු විශ්‍රාමික සංගමයේ, නිලවසරකට අදාලව, තේරිපත්වන විධායක කමිටුවකට සිය ඡන්ද දායකයන් වන සාමාජික සාමාජිකාවන් වෙනුවෙන්ම, ඔවුන්ගේ යහපත උදෙසා කළ යුතු වැඩ කොටසක් තියෙනව. නිල වසරක් තුළ දියත් කරන සියළුම වැඩ කොටස්වල ඉලක්කය වෙලා තියෙන්නෙ හැමෝම ''**සුවපත්**'' කිරීමයි. මෙහිදී ''**සුවපත් කිරීම**'' කියන්නේ පුළුල් අර්ථයක් ඇති දෙයක්. ඒ වගේම සුවපත් කිරීම තුළින් ජනිත වෙන්නෙ සතුටක්. ප්‍රීතියක්. මිහිරක්. සුවයක්. ජීවයක්. අළුත් වීමක්. උපන්දා ඉදලම අද මේ මොහොත වනතෙක්ම තත්පරයෙන් තත්පරය, විනාඩියෙන් විනාඩිය, පැයෙන් පැය, අවුරුද්දෙන් අවුරුද්ද, ඔබේ, මගේ, අපේ, ශරීරය පරිවර්තනය වූ හැටි අපේ මතකයේ නැහැ. ඒත් ඒ පිළිබඳව හිතාගන්න පුළුවන් වෙන්නේ ගත සිත ඔද්දල් වුනාම නෙමෙයි. අළුත් වීමකින් පුබුදු වුනාමයි. එකිනෙකා සමඟ දොඩමළු වුනාමයි, ඔද්දල්වුන සිතුවිලි පරම්පරාවෙන් ගත සිත මුදවාගෙන අළුත් ජවයකින් නැවුම් සිතිවිලි මාත්‍රයකටවත් ජවයක් දෙන්න පුළුවන් කම ලැබෙන්නේ දොඩමළු වුනාමයි. තම තමන්ගේ සහෘදයින් සමඟ, සමකාලීනයන් එක්ක එකට එකතු වුනාම ඒ අවස්ථාව නිරායාසයෙන්ම ලැබෙනව. එතකොට සෝ ලතැවුල් දුරු වෙනවා. සෝබර මුහුණු සුවබර වෙනව. සිනාව දෙතොලතර බිං ගැහෙනව.

අන්න ඒ අවස්ථාව යම් පමණකින් හෝ උදා වෙන්නේ විනෝද චාරිකාවලිනුයි. අවුරුද්දකට වතාවක්වත් විනෝද චාරිකාවක මගියෙක් වන්න.රසවතෙක් වන්න. චීන ජාතික ගායි ෂිංජෙන් කියන භික්ෂුව තමන්ට මුණ ගැහුන සංචාරකයෙකුට කියනවා මෙහෙම......''**හොඳ හෝ නරක වේවා ජීවිතය වනාහි චාරිකාවකි.....**'' කියලා. චාරිකාවක යෙදෙන විට අප ජීවත් වන බව අපට කියා දෙනව. හැමෝම ඉපදිලා ඉන්නේ ජීවත් වෙන්ටයි. හැබැයි නොමැරී සිටීම යැයි කියන්නේ ජීවත්වීම ද කියල හිතා බලන එක හොඳයි. විවිධ චාරිකාවන් ජීවිතයට විවිධ අර්ථ නිරූපන ලබා දෙනවා.

2014/2015 නිල වසරේ විශ්‍රාමික සංගමයේ තුන් දින චාරිකාව පසුගිය 6, 7 හා 8 වැනි දින වලදී දියත් වුණා. එම චාරිකාවට අප සංගමයේ සාමාජික සාමාජිකාවන් 80 ක් පමණ සහභාගි වුණා.

මුලින්ම, පැරණි මහ බැංකු සේවක සේවිකාවන් ගේ එකමුතුවේ උත්තරීතර කෘතඥතාවය නව අධිපතිතුමා ප්‍රමුඛ ඉහළ කළමනාකාරීත්වයට පිරිනැමෙනවා. ඒ අප වෙත සුපුරුදු ප්‍රවාහන පහසුකම් සැපයීම නම් වූ අනුග්‍රහයටයි.






සතුටින් ගිගුම් දෙමින් සුඛෝපභෝගී බස් රථ දෙක දෙහිවලිනුත් නුගේගොඩිනුත් ඉලක්ක බලා ඈතට ඇදුනා. මාර්ග සංවර්ධන කටයුතු නිසා සුළු ප්‍රමාදයක් වුනත් ඒක එච්චර දැනුනේ නෑ. දිවා ආහාරය සඳහා හබරණදී ටික වේලාවක් ගත කරන්න සිද්ධ වුණා.

සහභාගි වූ පිරිස විශාල නිසා නවාතැන් ගැනීමට සිද්ධ වුනේ හෝටල් දෙකක. පරාක්‍රම සමුද්‍රය ආසන්න ඉසව්වේ දර්ශනීය පරිසරයක් සහිත හෝටල්වල කාණ්ඩ දෙකක් හැටියට නවාතැන් ගත්තා. ආහාරපාන තෘප්තිමත් මට්ටමක තිබුණා.

දෙවැනි දවසේ ඉරමුදුන් වුනේ අපේ හෝටලේ ගේට්ටුවට උඩින්. උදේ සප්පායම් වෙලා බස් රථයට ගොඩවුනේ **පාසිකුඩා වෙරළ තීරුවට** යන්නනයි. දර්ශනිය වෙරල තීර, දැවැන්ත පාලම් හා කලපු

පහුකරමින් බස් රථය ගමන් කළේ ලාලිත්‍යකට බව කිව යුතුයි. ඔව් , ඇත්තටම , පාසිකුඩා කොතරම් දර්ශනීය වෙරළ තීරුවක්ද? ඒ හෝටලයත් දැකුම් කළුයි.



ප්‍රනීත දිවා ආහාරය ගත්තෙත් ඒ හෝටලයෙන්මයි.



නාවික හමුදාවේ මහත්වරු මුහුදේ නාන්න බහින හැමෝගේම ආරක්ෂාවට කැපවෙලා ඉන්නව. අපේ බොහෝ දෙනෙක් බයක්, සැකක්, නැතිව කරදිය නෑව. පීනුව. ජලක්‍රීඩා කළා. නිරෝගීකම රැක දෙන, එකවර ශරීරයේ සියළුම ඉන්ද්‍රියයන් සක්‍රීය වන ක්‍රීඩා දෙකක් තියෙනවලු. ඉන් එකක් තමයි ජල ක්‍රීඩාව. අනික තමයි ..... ක්‍රිඩා කියල එතන මුදේ නාන අය අතරෙ විවාදයකුත් ඇති වුනා. ඔව් ජල ක්‍රිඩාවන්, ......... ක්‍රීඩාවත් ශරීරයට නිරෝගී බව ලබා දෙනව.









පාසිකුඩා වෙරළෙන් පිටත්වෙලා අපි ගියේ ඓතිහාසික සෝමාවතී පුද බිමට.



සෝමාවතියෙන් අපි ආවේ නවාතැන් වලට. සුළු විවේකයක් අරගෙන අපි ඔක්කොම මහ නුගේ හෝටලයට එක් රොක් වුණා. එතන රස ගුලාවක්

මහ නුගේ හෝටලය විසින් ගායන සහ වාදන දෙකටම දක්ෂ ශිල්පීන් දෙන්නෙක් අපේ සතුට වෙනුවෙන් කැඳවලා තිබුණා. වටින් පිටින් අඳුර කැටි වෙද්දී 'මහ නුගේ හෝටලයට' සරස්වතී දේවිය බැල්ම දැම්ම. සත්සර නාද දුන්නා. එතැන් පටන් පැදුරු සාජ්ජය ගිගුම් දුන්නා. ගී පැදිවැල් සත්සර හා මුසු වුණා.

අපේ ගායක ගායිකාවෝ ගීත ගැයුවා. සිංහල, දමිල, හින්දි, ගීත ගලා හැලුනා. රිද්මයානුකූල නර්තනයනුත් ඉදිරිපත් කෙරුණා. එතන විනෝද වීම සඳහා විකට කථා, අභිරූපණ රංග, වේදිකා නාට්‍ය අංග ඉදිරිපත් කිරීමට සැලසුම් කරල තිබුණත් සියල්ලම ගීත වලට පමණක් සීමා වුණා.

පොළොන්නරු යුගයේ අවසානයේදී ලියවුනායැයි සමහර වියතුන් තර්ක කරන ප්‍රකට මහා කාව්‍යයක් වන '**කව් සිළුමිණ**' කාව්‍ය සංග්‍රහයේ එන මධුපානෝත්සවය ද සිහිපත් කෙරුණා. ගී පොතයි, මී විතයි එකම ඉසව්වකදි මුණ ගැහිලා.

පහුවදා පිබිදුනේ චාරිකාව හමාර කරමින් ගෙවල් දොරවල් බලා පිටත් වන්නට තිබෙන බව කල්පනාවට ගනිමින්. හෝටල්වල පිරිවැය ගෙවා දමා අපි ගියේ පොළොන්නරුව ඓතිහාසික නටඹුන් අතරටයි. පැරණි පැරකුම්බා රජ මාලිගාවට මුලින්ම ගියා. ඒ දැවැන්ත රජ මාලිගාව ගැන දැනුවත් වෙලා ආඩම්බරෙන් හිත පුරෝගත්තා. එතැනින් පිටත්වෙලා තවත් නටඹුන් බලාගෙන දර්ශනීය, පූජනීය, ඓතිහාසික '**ගල් විහාරයට**' ගියා. ලාංකීය ගල්වඩුවාගේ විශ්වකර්ම නිර්මාණ අතරින් කිහිපයක් වන ගල් පිළිම වහන්සේලා ගැන අවබෝධයක් ලබා ගත්තා. බොල් පිළිම නොවන ගල් පිළිම පිළිබඳව භක්තිය වර්ධනය කරමින් විස්තර කියා දෙන මිනිසුන් ව්‍යාජ තොරතුරු කියන බවත් වැටහුනා. මේ අපූරු නිර්මාණ දිහා බලාගෙන හිටියම සිත් නිවෙනවා. සිත් සුවපත් වෙනවා. ලෙඩ දුක් දුරු වෙනවා. මේ චාරිකාවේ ප්‍රධානතම පරමාර්ථය ඒක බව මුලින්ම සටහන් කළේ ඒකයි. සුව විඳින්න නම් සුවපත් වෙන්න ඕන. ඒකට එකම මග මොහොතකට හෝ පරිසරය වෙනස් කර ගැනීමයි. හැම චාරිකාවකින්ම ඒ සුවපත් වීම උදා වෙනවා. උදා කර ගත යුතුයි. ඊට හේතුව කාලය නොනවතින නිසයි. එය සොබාදහමේ රීතියයි.

**සංස්කාරක -**

# සැදෑ චාරිකා - 2015

වයිවාරන්නෙට ඇඳගෙන
බෑගය කර පින්නාගෙන
හිතේ සතුට පුරවාගෙන
කොහේද මේ උදෑසනම



තැනින් තැනට බසය පිරේ
මියුරු වදන් හඬ පැතිරේ
දොඩමලු වී කුරුලු රෑන
තුරුණුවියේ සිරිය ගෙනේ

කෝකිල නද පරදාලා
උසුළුවිසුලු හඬ නැගුනේ
උසුළුවිසුලු හඬ පරදා
කෝකිල හඬ යළි නැගුනේ

පාසිකුඩාවෙන් කරදිය නාලා
සෝමවතිය වැඳ පුදලා
ගලා හැලෙන හඳ පානේ
'මහ නුගේය' එකතු වුනේ

ඩොලැක් ගිටාර් හඬ අතරේ
සරස්වතිය වැඩම කළේ
හින්දි දමිල හෙළ ගීතා
කෝකිලයන්ගෙන් නැගුනා



එකගොන්නට එකතුවෙලා
ගයන වයන නටන අතරෙ
තිතතියන්න බැරි හින්දා
ඉස්පීකරෙ බොරු කිව්වේ

හඳ එළියට තිත තියලා
දොර වැහෙනව 'විලේජ්' එකේ
කළු ස්පීකරෙ කිව්වා
සාදය ඉන් නිමා කරා

පුලතිසිපුර විස්මිත කම්
සිතුසේ විපරම් කරලා
බස්රථයට ගොඩ වැදිලා
ගී මිහිරක යළි ගිලුනේ
ගමනේ බර කරටගත්තු
හැමදෙනාට තුති පුදලා



**සුමිත්‍රා තිලකරත්න**
**(1368)**
**071 4985235.**

# ප්‍රාදේශීය නියමු මෙහෙයුම

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය තම වාර්ෂික මහ සභා රැස්වීම අප්‍රියෙල් මස 26 වන දින පැවැත්වීමට දැනටමත් තීන්දු කොට ඇත. සාමාන්‍ය පරිදි මහා සභා රැස්වීමකදී ඒ ගත කළ වසරේ ලැබූ අත්දැකීම් අලලා ලේකම් වාර්තාවක් සාමාජිකත්වය හමුවේ තැබීම සම්ප්‍රදායකි. සංගමය ලැබූ ප්‍රගතිය හා අත්දුටු විශේෂ කරුණු එම වාර්තාවෙහි අඩංගු වීම ස්වභාවයකි. නමුත් මේ උත්සාහ කරන්නේ, ලේකම්ගේ වගකීම අප විසින් ඉටු කිරීමට නොවේ.

## ප්‍රගතිශීලී නැමියාව

කෙසේ වෙතත් පසුගිය වසරේ දී විශ්‍රාමික සංගමය තුළ මා අත්දුටු ප්‍රගතිශීලී නැමියාව වන්නේ, රට පුරා විසිර සිටින පුළුල් සාමාජිකත්වය තුළට ගමන් කිරීමට දියත් කළ වැඩ පිළිවෙළයි. මුළුමනින්ම සාර්ථක කර ගත නොහැකි වූ නමුදු ආරම්භයක් වශයෙන් යම් පිය සටහන් කීපයක් තැබීමට අපි සමත් වීමු.

තමන්ගේ වෘත්තීයමය ගැටළු විසදා ගැනීමට එක තැනකට රැස්ව වාද විවාද කරමින් පොදු සම්මුති එකඟතාවයන්ට පැමිණ, ඉනුත් එහාට ගිය උද්ඝෝෂණ ක්‍රියාවලියන්ට පවා අවතීර්ණ වූ අපි අද විශ්‍රාමිකයින් වශයෙන් රට පුරා විසිරී තම තමන්ගේ නිවෙස්වලට කොටු වී, තමන්ගේ හිමිකම් අයිතිවාසිකම් ආදී වූ බොහෝ ප්‍රශ්න හඳුනාගත නොහැකිව, ඇතැම් විට විසඳුම් සොයා ගත නොහැකිව, හුදකලා උකටලී ස්වභාවයට පත්ව වෙසෙමු. සමහරු 'මට මහළු වයසේ බැරිය වෙණ ගායනා පෙරසේ' යන ශික්ෂා පදය සමාදන්ව බවුන් වඩති. මහ බැංකුව ඇතුලතදීත් අපට හිමි දේ අප දිනාගත්තේ කාගේවත් කරුණාවකට නොවේ. කිසිවෙකු අපට කිසිදෙයක් ගෙනවිත් පූජා කළේ නැත. අදට ඒ නියමය එසේමය. බැරි බැරි ගානේ හරි හිත වෙර වඩාගෙන අතට හිතට සරිලන හැම ක්‍රමවේදයක් ම උපයෝගී කොටගෙන අප ශක්තිමත්ව නැගී සිටියහොත් විනා, අපට සිදුවන්නේ කෙඳිරි ගගා ටිකෙන් ටික ගමනාන්තයට සේන්දු වීමටය.

## පොදු වේදිකාව

අද අපට ඇති පොදු වේදිකාව ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයයි. දුක කියන්නට. පිහිටක් ලබන්ට, එකට එකතුව අත්වැල් බැඳගෙන දුක සැප බෙදා ගන්නට අප සැවොම ගොනු විය යුතු සංවිධානය ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයයි. ඒ සංවිධානය ශක්තිමත් වුවහොත් අප සැම දෙනාටම ප්‍රබල ශක්තියක්. ඒ නිසාම සියලුම මහ බැංකු විශ්‍රාමිකයින් ඒ වටා පෙළගස්වන්නට උත්සුක විය යුතුය. දැනට ගොනු වී සිටින සාමාජිකත්වය පුබුදුවා දැනුවත් කොට යම් අරමුණකට මෙහෙයවා ගත හැකි ජංගම බලවේගයක් බවට පමුණුවා ගත යුතුය. මේ වෙනුවෙන් නිද්‍රෝපගත සාමාජිකත්වය අවදි කොට ගත යුතුය. ඔවුන් අප කරා ආකර්ශනය නොවන්නේ නම් අපඔවුන් කරා යා යුතුය. ඔවුන්ගේ කටහඬ අපේ සවනට වැද්දගත යුතුය. අපේ වචනය ඔවුන්ට තෝරා බේරා දිය යුතුය. ඔවුන්ගේ අතත් අපේ අතත් එකට ඇද බැඳ ගත යුතුය. යුක්තිය හා බලය උපදින්නේ එතැනය. මේ කර්තව්‍යය උදෙසා මෙහෙයැවුණු, සාර්ථක කර ගත හැකි උපාය ක්‍රමයක් වශයෙන් '**ප්‍රාදේශීය නියෝජිත සංකල්පය**' මම අගය කරමි.

## අළුත් ගමනක්

මීට දෙවසරකට පමණ පෙර සංගමයේ හුදු සාමාජික අවමංගල්‍ය අවශ්‍යතාවයක් උදෙසා ගරු සභාපති ලක්ෂ්මන් ද සිල්වා මහතා අතින් දොරට වැඩුණු මෙම වැඩ පිලිවෙළ මේ ගෙවන වසර තුළදී වඩාත් ඵලදායීව භාවිතයේ යෙදවීමට අපි උත්සාහයක් දැරීමු.

සමහරෙකුට මෙය වටහා දීමට අසීරු විය. සමහරෙකු මේ දෙස බැලුවේ වපරෙටය. ඇතැමෙකුගේ මතය අනුව මේ නැති ලෙඩ කරේ දමා ගැනීමකි.'දැන් ඉතින් අපි මොනව කරන්නද? ඔහේ ලැබෙන හැටියක්' සමහරු දෑතින් විලි වසා ගත්හ. වයසට උපදින උකටලීකම පරාණ උරුමයක් කර ගත්තාහු අනම් මනම් දෙඩවූහ. එහෙත් මේ සැවොම පරයමින් ශක්තිමත්, එඩිතර, ප්‍රගතිශීලි සිත් ඇත්තෝ සිටියහ. ඔවුහු මේ ව්‍යායාමය අවබෝධ කොට ගත්හ. මේ තුළින් අපේ අරමුණු සාධනය උදෙසා තමන්ගේ දායකත්වය පිරි නැමීමට එකඟ වූහ.

රට පුරා විසිරුණු 19 දෙනෙකුගෙන් යුත් ප්‍රාදේශීය නියෝජිත පර්ශදය මේ වසර තුළදී තෙවරක් මහ බැංකුව තුළදී මුණ ගැසුණාහ. සහභාගිත්වය ඉතා ඉහළ අගයක් ගත්තේය. ඔවුන් සමඟම විශ්‍රාමික සංගමයේ විධායක කමිටු සභිකයෝද එක්වූහ. ප්‍රාදේශීය නියෝජිත වැඩ පිළිවෙළෙහි පුළුල් අරමුණ කරා ක්‍රමිකව සේන්දු වීමට සපථ කළ නියෝජිතයෝ තමන් අබිමුව ඇති ගැටළු හා අවශ්‍යතා සම්බන්ධව සාකච්ඡා කළහ. තෙමසකට වරක් එක්රැස්වීමට තීරණ කළහ. 'සැඳෑව' ප්‍රකාශනය ඔස්සේ ඒ ඒ ප්‍රාදේශීය නියෝජිතයන් සාමාජිකත්වයට හඳුන්වා දීමට එකඟ වූහ. අවමංගල අවස්ථාවන්හි ප්‍රදර්ශනය සඳහා පොදු ශෝක ප්‍රකාශිත බැනරයක් සකස් කර සියලුම නියෝජිතයින් අතර බෙදා දෙන්නත්, මහ බැංකු විශ්‍රාමික අවමංගල්‍යයක් උදෙසා මහ බැංකුවෙන් පිරිනමන මල්වඩමට හා ඒ ප්‍රවාහනය සඳහා මහ බැංකුවෙන් ප්‍රතිපූර්ණය කරන මුදල වැඩි කර ගන්නත්

පියවර ගැනීමට යොමු වූහ. ඒ ඒ ප්‍රදේශවල විශ්‍රාමිකයන්ගේ සංගමයේ සාමාජිකත්වය අතර සුහදතාවය තහවුරු කරන අභිප්‍රායෙන් එකමුතු විනෝද සාද, විනෝද ගමන්, සුභසාධන කටයුතු, රෝගී සත්කාර සේවා ආදී තවත් එවැනි ක්‍රියාකාරකම්වල යෙදීමේ වැදගත්කම පිළිගත්හ. මේ සෑම හමුවකදීම විශ්‍රාමිකයන්ට බලපාන වැටුප්, ණය ක්‍රම හා සුභ සාධන අවශ්‍යතා ආදිය හා අදාලව පවත්නා තත්වයන් පිළිබඳව අදහස් උදහස් සාකච්ඡා කිරීම ඉතා වැදගත් කාරයක් විය. එම තොරතුරු ඒ ඒ ප්‍රදේශ වලට ගලා යාමට සැලැස්වීම මෙම පියවරේ අරමුණ විය.

## සුභ දායක පියසටහන්

මෙම ක්‍රියාදාමය විසින් දිරිමත් කරනු ලැබූ පිළියන්දල ප්‍රාද්ශීය නියෝජිත හේමා විමලසෝම මහත්මියගේ මෙහෙයවීමෙන් එම ප්‍රදේශයේ මහ බැංකු විශ්‍රාමිකයින් එක් රැස් කෙරුණු සාකච්ඡා සභා දෙකක් දැනටමත් පවත්වා තිබෙනවා. සංගමයේ ප්‍රධාන කාර්යාලය නියෝජනය කරමින් ගරු සභාපති ලක්ෂ්මන් ද සිල්වා, ගරු ලේකම් ජයලාල් ජයවර්ධන. ගරු උප සභාපති, ආරියදාස තන්ත්‍රිගේ හා ගරු උප ලේකම් අමරපාල කරසිංහආරච්චි යන මහත්වරු සහභාගීව සාමාජිකත්වය දැනුවත් කළහ. මෙම රැස්වීම්වලදී විශ්‍රාම වැටුප් විෂමතාවය නිරාකරණය කර ගැනිමේ ක්‍රියා මාර්ගය පිළිබඳ තොරතුරුවලට අමතරව සාමාජික ප්‍රවර්ධනය, සාමාජික දායකත්වය සහිත අවමංගලයාධාර ක්‍රමය, රෝහල් බිල්පත් ගෙවීමේදී ඇතිවන අපහසුතා මඟහරවා ගැනීම ආදී කාරණා ගැන ද සාකච්ඡා කෙරුණා. මහ බැංකු විශ්‍රාමිකයෙකු වන දැනට ඇඹිලිපිටියේ පදිංචි එමානිස් මහතාගේ රෝගී තත්වය පිළිබඳව විමසා බලා ඔහුට යම් ආධාර මුදලක් පිරිනැමීම අරමුණු කරගෙන යාමට සූදානම් වන රෝගී සත්කාර වැඩපිළිවෙළක් පිළිබඳව ද කරුණු මෙහි දී අනාවරණය විය.




ගාල්ල ප්‍රාදේශීය නියෝජිත එල්. එදිරිසිංහ මහතා ද මේ ප්‍රාදේශීය නියෝජිත සංකල්පය මැනවින් ග්‍රහණය කරගත් අයෙකු වශයෙන් හැඳින්විය හැකිය. මේ වන විට, ඔහු සිව්වරක් ගාල්ල ප්‍රාදේශීය සාමාජිකයන් සම්බන්ධ කරගෙන හමුවීම් පවත්වා ඇත. ප්‍රදේශයේ සාමාජික අනුග්‍රහය යටතේ ඒ ඒ නිවෙස්වල මෙම රැස්වීම් සිදු කර ඇති අතර ඒ පිළිබඳව මධ්‍යස්ථානය දැනුවත් කිරීමට ද පියවර ගෙන ඇත. ප්‍රධාන ලේකම් ජයලාල් ජයවර්ධන මහතා සහ උප ලේකම් අමරපාල කරසිංහආරච්චි මහතා මේ රැස්වීම් වලට සහභාගි වී විශ්‍රාමිකයින්ගේ ප්‍රශ්න පිළිබඳව පවත්නා තත්ත්වය හා අළුත් ක්‍රියාමාර්ගයන් පිළිබඳව සාමාජිකත්වය දැනුවත් කිරීමට පියවර ගත්හ.



ගම්පහ ප්‍රාදේශිය සාමාජික හමුව පැත්වුණේ ගම්පහ ප්‍රාදේශිය නියෝජිත ඩී. ආර්. දයාවංශ මහතාගේ සංවිධායකත්වයෙනි. ගරු සභාපති ලක්ෂ්මන් ද සිල්වා සහ කමිටු සභික සේ. දො. කරුණාරත්න යන මහත්වරු විධායක කමිටුව නියෝජනය කළහ. විශ්‍රාමිකයින්ගේ සංගමයේ ප්‍රාදේශීය සංවිධානයක හා වෙනත් අරමුණු ඔස්සේ ක්‍රියාත්මක විශ්‍රාමික සංවිධානයක හා අතර පවතින වෙනස හඳුනාගැනීමට දීර්ඝ හා සවිස්තරාත්මක සාකච්ඡාවක් ඇති වීම මෙම හමුවේ විශේෂත්වයක් වීය. කෙසේ වුව ද ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨත්වය, ශ්‍රේෂ්ඨත්වය හා ප්‍රමුඛත්වය කුළුගැන්වුණු අනන්‍යතාවයට අභියෝගයක් නොවන පරිද්දෙන් වෙනත් සමීප අරමුණු ඔස්සේ සුහද එකමුතු බිහිවීමේ වරදක් නොදුටු සාමාජිකයෝ විශ්‍රාමිකයින්ගේ සංගමයේ ව්‍යාප්තිය හා ශක්තිමත් ක්‍රියාකාරීත්වය උදෙසා හඳුන්වා දෙනු ලැබූ ප්‍රාදේශිය නියෝජිත සංකල්පය ද ප්‍රබල මෙහෙයුමකි යි පිළිගත්හ. කොහේ හිටියත් මහ බැංකු විශ්‍රාමිකයින් ජීවමානව, ක්‍රියාකාරීව, සාමූහිකව සිටීම ඉතා වැදගත් කාරණයක් ලෙස කාගේත් පිළිගැනීමට ලක් වීය.

තවත් ප්‍රාදේශීය සාමාජික රැස්වීම් කිහිපයක්ම පැවැත්වීම සඳහා කෙරුණු සාකච්ඡා ඉදිරි දින කිහිපයේ දී එල දරනු ඇති බව විශ්වාස කටයුතුය. ඒ සෑම හමුවකටම සංගමයේ විධායක කමිටු නියෝජියින් සහභාගීව ඔවුන් දිරිමත් කරණු ඇත. කෙදිනක හෝ මහ බැංකු විශ්‍රාමිකයින්ගේ ගැටලු නිරාකරණය උදෙසා සාමූහික සාමාජික ශක්තිය මෙහෙයවා ගැනීමේ අවශ්‍යතාවයක දී මෙම ප්‍රාදේශීය නියෝජිත වැඩ පිළිවෙළ මහෝපකාරී වන්නේය.

**සේ. දො. කරුණාරත්න(995)**
**සම්බන්ධීකාරක**



# විශ්මිත විශ්වය



විශ්වය තාරකා (ඉර), සඳ. ග්‍රහලෝක, ග්‍රහවස්තූන් සහ දූවිලි පටල වලින් ද, සෞර්‍ය ග්‍රහ මණ්ඩල, චක්‍රාවාට, සුපිරි චක්‍රාවාට වලින් සමන්විත විෂ්මය ජනක ස්වභාවික නිර්මාණයකි.

ක්ෂීර පථය (Milkyway) අතිශය වැදගත් සහ විශ්මය ජනක චක්‍රාවාටයකි. එය ආලෝක වර්ෂ 100,000-120,000 විශ්කම්භයක විහිදී ඇත. අප ජීවත් වන පෘථිවිය පිහිටා ඇත්තේ මෙම ක්ෂීර පථ චක්‍රාවාටය තුළය. එය මිනිස් වර්ගයාගේ මෙන්ම අනෙකුත් සත්ව වර්ගයාගේ ද උත්පත්ති ස්ථානයයි. අප වසනා සෞර්යග්‍රහ මණ්ඩලය මෙම ක්ෂීර පථය චක්‍රාවාටය තුළ පිහිටා ඇත. අප වසනා සෞර්යග්‍රහ මණ්ඩලය පිහිටා ඇත්තේ ක්ෂීර පථය මධ්‍යයේ සිට ආලෝක වර්ෂ 27,000 පමණ ඈතිනි. ක්ෂීර පථයට ළඟින්ම ඇති චක්‍රාවාට නම් යෝධ සහ කුඩා මැගලනික් පටල වේ. (Megallanic Clouds) විද්‍යාඥයින් සලකන්නේ මෙම මැගලනික් පටල ක්ෂීර පථයට අයත් උප චක්‍රාවාට ලෙසයි. යෝධ මැගලනික් පටලය අපගේ චක්‍රාවාටය සිට ආලෝක වර්ෂ 163,000 පමණ ඈත පිහිටා ඇත. සාමාන්‍යයෙන් ආලෝක වර්ෂයක්, සැතපුම් ට්‍රිලියන 5.9 පමණ වේ.

ක්ෂීර පථය තුළ අපට ළඟින්ම ඇති තරු මණ්ඩලය (Stela System) වන්නේ, ඇල්ෆා සෙන්ටියුරි (Alfa Centuri) වේ. මෙය පිහිටා ඇත්තේ ආලෝක වර්ෂ 4. 4 ඈතිනි. අපගේ වේගයෙන්ම යන අභ්‍යවකාශ යානයකට මෙයට ළඟා වීමට වර්ෂ 100,000 පමණ ගතවේ. ක්ෂීර පථය ළඟින්ම ඇති චක්‍රාවාටය නම් ඇන්ඩ්‍රොමිඩා චක්‍රාවාටයයි. පෘථිවියේ සිට ඇන්ඩ්‍රොමියිඩා චක්‍රාවාටයට (Andromeda galaxy) ඇති දුර ප්‍රමාණය අලෝක වර්ෂ මිලියන 2.5 පමණ වේ. (NASA)

විශ්වයේ ඇති චක්‍රාවාට අද එකින් එක ඈත්වන බව වටහා ගෙන ඇත. මෙම විශ්වයේ ප්‍රසාරණය සොයා ගනු ලැබුයේ එඩ්වින් හබල් නම් විද්‍යාඥයා විසිනි. අපට ආසන්නයේ ඇති චක්‍රාවාට වලට වඩා ඈතින් ඇති චක්‍රවාට වල ඈත්වීම ඉතා වේගයෙන් සිදුවේ. මෙම ඈත්ව පිහිටි චක්‍රාවාට වල ඈත් වීමේ වේගය තත්පර 1ට කී. මී. 1,44,000 වේ. මෙය ආලෝකය ගමන් කරන වේගයට වඩා 50% පමණ අඩුය. මෙසේ වේගයෙන් ඈත්වන චක්‍රාවාට, විශ්වයේ ප්‍රශාසරණය යනුවෙන් හඳුන්වා ඇත. විශ්වයේ බිලියන 200 පමණ චක්‍රාවාට ඇති බව ගණන් බලා ඇත.

<u>ක්ෂීර පථ චක්‍රාවාටයේ විශ්මිත ස්වභාවය කෙටියෙන් සලකා බලමු.</u>

**01.** ක්ෂීර පථය චක්‍රාවාටය තරමක් ඇලව පිහිටා ඇත.

නාසා සහ හබල් දුරේක්ෂය (NASA/HUPP) මගින් ලබා ගත් ඡායා රූප වලට අනුව මෙය මදක් ඇලව පිහිටා ඇති බව තහවුරු වී ඇත. මෙය මෙසේ වුවත් ක්ෂීර පථය රවුම් (Disk) හැඩයක් ඇති චක්‍රාවාටයක් ලෙස පළමුව අධ්‍යනය කරන අයකු සැලකීම උචිත වේ.

**02.** ක්ෂීර පථය චක්‍රාවාටය මධ්‍යයේ (කලු) කාල කුහරයක් ඇත.

ක්ෂීර පථය 90% පමණ කාල වර්ණ ද්‍රව්‍ය වලින් (Dark matter) සෑදී ඇත. මෙම කාල වර්ණ ද්‍රව්‍ය මගින් මධ්‍යයේ කාල කුහරය නිර්මාණය වී ඇත. මෙම කාල කුහරය අධික ගුරුත්වාකර්ෂණ බලයකින් යුක්ත වේ. සුපිරිනෝවා තරුවක් පිපිරීමකින් පසු න්‍යෂ්ටිය ඉතිරි වී, වටා ඇති ද්‍රව්‍ය අභ්‍යවකාශයට විසි වී යයි. මෙවැනි තාරකා වල න්‍යෂ්ඨිය කාල කුහරය තුළ රඳා පවතී. කාල කුහරයේ ඇති අධික උෂ්ණත්වය හා පීඩනයත්, ගුරුත්වා කර්ෂණයත් නිසා තරුවල දීප්තිය එළියට නොපෙනේ. පියවි ඇසට හෝ දුරේක්ෂ වලට මෙය දිස් වන්නේ ද නැත. පියවි ඇසට හෝ දුරේක්ෂ වලට පෙනෙන්නේ ක්ෂිර පථයෙන් 10% පමණ ප්‍රමාණයකි. අපගේ සෞර්‍ය ග්‍රහ මණ්ඩලය මෙන්ම අනෙකුත් ග්‍රහ මණ්ඩල ද ක්ෂීර පථයේ මධ්‍ය වටා සීඝ්‍රයෙන් භ්‍රමණය වේ. මෙසේ සිදුවන්නේ මධ්‍යයේ පිහිටි කාල කුහරයේ ඇති අධික ගුරුත්වාකර්ෂණ බලය නිසාය.

**03.** ක්ෂිර පථය තුළ (ඉරවල්)තාරකා බිලියන 200 පමණ ඇත.

විශ්වයේ ඇති චක්‍රාවාට වලින් තරමක් කුඩා ප්‍රමාණයේ චක්‍රාවාටයක ක්ෂිර පථය. විද්‍යාඥයින් විශාලතම චක්‍රාවාටය ලෙස හඳුන්වා ඇත්තේ 1c1101 ලෙසිනි. මෙම 1c1101 චක්‍රාවාටයේ පිහිටා ඇති ඉරවල් (තාරකා) ප්‍රමාණය ට්‍රිලියන 100 (Trilion 100) පමණ වේයැයි ගණන් බලා ඇත. ප්‍රමාණයෙන් මීට කුඩා වුවත්, එම චක්‍රාවාට තුළ ඇති තාරකා ගණන ට්‍රිලියන 1ක් පමණ වේ යැයි දක්වා ඇත. මෙම චක්‍රාවාට ක්ෂිර පථයට වඩා විශලත්වයක් ඇති ඒවා බව තහවුරු වේ. ක්ෂිර පථයේ පිහිටා ඇති තාරකා ගණන බිලියන 200 පමණ බව විද්‍යාඥයින් පෙන්වා දෙයි.

**04.** දූවිලි සහ ගෑස් සහිත සංයුතියක් ඇත.

ක්ෂිර පථය දූවිලි සහ ගෑස් සහිත සංයුතියක් ද ඇත. ස්පිට්සර් අභ්‍යවකාශ දුරේක්ෂය (Spitzer space Telescope) (Cedit NASA / JPC - caltech) මගින් කරන ලද නිරීක්ෂණ මගින් මෙය තහවුරු වේ. එහෙත් මෙය පියවි ඇසට දිස්විය නොහැක. ක්ෂිර පථය චක්‍රාවාටයේ 10%- 15% දීප්තිමත් ද්‍රව්‍ය වලින් නිර්මාණය වී ඇත. ක්ෂිර පථය චක්‍රාවාටය ආලෝක වර්ෂ 100, 000 - 120,000 පමණ විශ්කම්භයක් විහිදී ඇතත් අපට පෙනෙන්නේ ඉන් ආලෝක වර්ෂ 6000 පමණ ප්‍රමාණයකි. මෙහි ඝනත්වය ආලෝක වර්ෂ 10,000 ක් 15,000ක් අතර වේ.

**05.** ක්ෂිර පථය, ආසන්නයේ ඇති කුඩා චක්‍රාවාට ගිල ගනිමින් ඇත.



ක්ෂිර පථය (Mulkey way) අතීතයේදී වර්තමානයේ පවතින සේ නොතිබෙන්නට ඇත. මෙය අද පවතින ප්‍රමාණය සහ හැඩය ගෙන ඇත්තේ එය වටා ඇති කුඩා චක්‍රාවාට ඇද ගනිමිනි. ක්ෂිර පථයට ලගින්ම පිහිටි කේන්ස් මේජර් ඩ්වාර්ෆ් චක්‍රාවාටය (Cains Magor Dwarf galaxy) ඇති තාරකා (stars) ක්ෂිර පථය තවමත් තම පථයට ඇද ගනිමින් ඇත. ක්ෂිර පථය මෙලෙස අතීතයේදීත් මෙවැනි චක්‍රාවාට ගිලගෙන ඇත. එනම් සැගිටේරියස් ඩ්වාරිෆ් චක්‍රාවාටයයි. (Sagitarius Dwarf galaxy)

**06.** ඔබ දක්නා චක්‍රාවාටයක පින්තූරයක් හෝ කවුරුන් විසින් හෝ අඳින ලද චක්‍රාවාටයක චිත්‍රයක්, වෙනත් චක්‍රාවාටයක් දෙස බලා අඳින ලද පින්තූරයක් හෝ චිත්‍රයක් හෝ විය හැකිය.

සම්පූර්ණ ක්ෂිර පථයේ පින්තූර ගැනීමට හෝ චිත්‍ර ඇඳීමට හෝ හැකි නොවේ. එයට හේතුව වන්නේ, අප ක්ෂිර පථය තුළම සිටිමයි. මෙම චක්‍රාවාටය මධ්‍යයේ සිට ආලෝක වර්ෂ 26000 ක් ඈතින් පිහිටා ඇත. මෙය හරියටම අපගේ නිවස තුළ හිදිමින් නිවසේ සම්පූර්ණ පින්තූරයක් ගැනීමට තැත් කරනවා වැනිය. එය කළ නොහැකිය. අපට පින්තූර ගත කර ගත හැකිවන්නේ, එක් කොටසක් හෝ පැත්තක් පමණි. එම නිසා ක්ෂිර පථයට පිටතින් ඇති චක්‍රාවාට දෙස බලා එම හැඩතල අනුව චිත්‍ර ඇඳීම හෝ පින්තූර ගැනීම කළ හැකි වේ.

**07.** මධ්‍යයේ කාල කුහරය (There is a black hole at the center)

ක්ෂිර පතයේ ඇති (කළු) කාල කුහරයට (Black hole) සැගිටේරියස් A (Saggittcrius A) යන නාමය විද්‍යාඥයින් විසින් ලබා දී ඇත. මෙම කාල කුහරය තුළ තාරකා හෙවත් සූර්යයන් 40,000 පමණ ඇත. මෙය කිලෝ මීටර මිලියන 22.5 (සැතපුම් මිලියන 14) පමණ විහිදී ඇත. ක්ෂිර පථයේ ඇති කාලකුහරයේ ඝනත්වය අපගේ සූර්‍ය්‍යා මෙන් මිලියන 4.5 වේ.

**08.** ක්ෂිර පථයට විශ්වය තරම්ම ආයුෂ කාලයක් ඇත. විශ්වය නිර්මාණය වී වර්ෂ බිලියන 13.7 වනු ඇතැයි විද්‍යාඥයන් විශ්වාස කරයි. එසේම ක්ෂිර පථය ද නිර්මාණය වී වර්ෂ බිලියන 13.6 පමණ වනු ඇතැයි විශ්වාස කරනු ලැබේ.

**09.** ක්ෂිර පථය විශාල හෙවත් (සුපිරි) වර්ගෝ සුපිරි පොකුර (Virgo Superclustcr)චක්‍රාවාට පද්ධතිය තුළ පිහිටා ඇත. මෙය ආලෝක වර්ෂ මිලියන 150 අතර විහිදා ඇත.

ක්ෂිර පථය විශාල සුපිරි චක්‍රාවාට පද්ධතියක් තුළ පිහිටා ඇත. අපට කිට්ටුම චක්‍රාවාට ලෙස යෝධ සහ කුඩා මැගලනික් පටල පිහිටා ඇත. මෙම පටල ක්ෂිර පථයේ උප චක්‍රාවාට ලෙස විද්‍යාඥයන් සලකති. අපිට ලගින් ඇති ප්‍රධාන චක්‍රාවාටය ඇන්ඩ්‍රෝමීඩා චක්‍රාවාටයේ පොකුරු 100 ට වඩා ඇත. 2014 දී කරන ලද පර්යේෂණ අනුව සුපිරි වර්ගෝ වර්ගයේ පොකුරු විශාල සංඛ්‍යාවක් ඇති බව නිරීක්ෂණය කර ඇත. විශ්වය (Universe) සෑදී ඇත්තේ මෙවැනි චක්‍රාවාට වලිනි.

**10.** මේ සියල්ලම භ්‍රමණය වේ.

මේ ක්ෂිර පථය මෙන්ම අනෙකුත් චක්‍රාවාට ද භ්‍රමණය වේ. පෘථිවිය සහ ග්‍රහලෝක සූර්‍ය්‍ය වටාද, සූර්‍ය්‍ය හා සෞර්ග්‍රහ මණ්ඩල ක්ෂිර පථය වටාද, ක්ෂිර පථය සුපිරි වර්ගෝ පද්ධතිය වටාද භ්‍රමණය වේ. මෙම භ්‍රමණ වේගය තත්පර 1ට කිලෝ මීටර් 600 හෙවත් පැයට කිලෝ මීටර් මිලියන 2.2 බව ගණන් බලා ඇත.

**අරමුණ**

මෙම ලිපියෙහි අරමුණ වන්නේ පාඨකයින්ට අප විශ්වය පිළිබඳ අංශු මාත්‍රයක හෝ දැනුමක් ලබා දීමය.

.



**ජයලාල් ජයවර්ධන**

**0777 412289**



# වන සිව්පාවුන් වැනි මිනිසුන් මැද දෙවිදේවතාවුන් වැනි මිනිසුන් ඇත....

ශ්‍රී ලංකා මහ බැංකු සේවා නියුක්තියන්ගේ අර්ථසාධක අරමුදල් භාරකාර මණ්ඩලයේ සාමාජික ඡන්දයෙන් තේරිපත්වූ නියෝජිතයා ලෙස දීර්ඝ කාලයක් සේවාව කලාවූ ද, මහ බැංකු සේවක සංගමයේ හිටපු ගරු සභාපති වරයෙකුවූ ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ හිටපු ගරු සභාපති වරයෙකුවූ ද, ඉන්ද්‍රබිලය " සංවිධානයේ නිර්මාතෘවූ ද, ආත්මාර්ථය ඉක්මවූ වීර්ය පාරමිතා පිරිම " නිසා සූර්ය ලංකා" සම්මානයෙන් බුහුමන් ලැබූ ලෙස්ලි රණසිංහ මහතා 2015 මාර්තු මස 03 දින අභාවප්‍රාප්ත වූ අතර ඔහුගේ ඉල්ලීම පරිදි ආගමික වතාවත් පමණක් පවත්වා එදිනම සවස 3.00ට කොළඹ වෛද්‍ය විද්‍යාලයට දේහය භාරදෙන ලදි.

1940 අප්‍රේල් මස 21වන දින උපත ලබා 1962 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකු සේවාවට අවතීර්ණවූ ලෙස්ලි රණසිංහ මහතා ආරම්භයේ සිටම අප්‍රතිහත ධෛර්යෙන් යුක්ත වූ සමාජ ක්‍රියාධරයෙක් විය. සාමාජික ප්‍රසාදය නිසාම ඔහු අර්ථසාධක අරමුදල් භාරකාර මණ්ඩලයේ සේවක ඡන්දයෙන් තේරිපත්වූ සාමාජිකයා විය. ඔහු අවුරුදු 10කටත් වැඩි කාලයක් නොකඩවාම මෙම ධූරය දරණ ලදි. හදිසි අවශ්‍යතාවයකදී අරමුදලේ බැර ශේෂයෙන් 40% ක ප්‍රමාණයක් ණයක් වශයෙන් ලබාගැනීමට සේවකයනට තිබූ අයිතිවාසිකම වෙනුවෙන් ඔහු පෙනි සිටියේය. මීට අමතරව භාරකාර මණ්ඩලයේ අනිකුත් සාමාජිකයන් සමග එක්වී අරමුදලේ පැවැත්ම සහ ඉහළම ප්‍රතිලාභ ලැබෙන පරිදි ආයෝජන කිරීම කෙරෙහි ද ඔහුගේ අවධානය යොමු විය. මේ නිසා මහ බැංකු සේවකයන්ගේ ගෘහ ආර්ථිකයේ යථා තත්වය පිළිබඳව හොඳ අවබෝධයක් ලෙස්ලිට විය.

සේවක පක්ෂයේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනි සිටිමේ දී ලෙස්ලිට බොහෝ විට අරමුදලේ අනෙක් සාමාජිකයන්ට එරෙහිව විවාදා පන්න වීමට සිදුවිය. මෙය ඇතැම් විට පාලන අධිකාරියේ නොමනාපයට හේතු වුව ද මේ පොදු මිනිසාට සියල්ලෝම ගරු කලහ. අරමුදලට ඉහළම පොලි අනුපාතයක් ලබා ගැනිම උදෙසා. ඔහුගෙන් සිදුවූ මැදිහත්වීම පැසසුමට ලක් විය.

මහබැංකු අර්ථසාධක අරමුදලට අමතර වශයෙන් මහ බැංකු සේවා නියුක්තිකයනට තවත් විශ්‍රාම වැටුප් අරමුදල් ක්‍රමයක් විය. සේවකයා විශ්‍රාම යන විට එක්වර ගෙවීමක් මෙම අරමුදලෙන් ප්‍රධානය කරන ලදි. තම අත්දැකීම් අනුව මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමය මෙන් මාසිකව ලබා ගත හැකි නම් අනාගතයේ දී වාසිදායක විය හැකි බව ලෙස්ලි කල්පනා කළේය. සිය හිතවෙතෙකු වූ අභාවප්‍රාප්ත උපාලි පෙරේරා මහතා සහ තවත් කිහිප දෙනෙකුගේ උපදෙස් පරිදි සාමූහික ප්‍රයත්නයක් ලෙස මාසික විශ්‍රාම වැටුප් ක්‍රමයක් කෙරෙහි පාලන අධිකාරියේ අවධානය යොමු කරවීය. සියල්ලෝම පුදුමයට පත් කරමින් වැඩි ප්‍රසිද්ධියක් නොමැතිව ම මහ බැංකු සේවක මාසික විශ්‍රාම වැටුප් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පාලන අධිකාරිය එකඟ විය. රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට සමගාමීව ක්‍රියාත්මක කළ මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය මත විශ්‍රාම ලබාගන්නා විට ලැබෙන මාසයේ අන්තිම වැටුපෙන් 90%ක් විශ්‍රාම වැටුපක් ලෙස හිමිකර ගැනිමට මහ බැංකු සේවකයන්ට අවස්ථාව උදාවිය. අද අප භුක්ති විඳින්නේ මෙම වරප්‍රසාදයයි.

මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය අවධානමකට ලක්වී ඇති **වර්තමානයේ දී තමතමන්ගේ විශ්‍රාම වැටුප** වැඩිකර ගැනීම නොව පොදුවේ මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය ආරක්ෂාකර පවත්වා ගැනීම වෙනුවෙන් කැපවූ ලෙස්ලිගේ ආදර්ශය එදාට වඩා අද බෙහෙවින්ම වටින්නේය. එය ආත්මාර්ථය ඉක්මවූ වීර්ය පාරමිතාව පිරීමකි .

මහ බැංකුවට 1996 බෝම්බ ප්‍රහාරය එල්ලවූ වකවානුවේ ලෙස්ලි මහබැංකු සේවක සංගමයේ ගරු සභාපති වරයා විය. මෙම ප්‍රහාරයෙන් ලෙස්ලිගේ ප්‍රිය බිරිඳ අහිමි වූ අතර කුඩා දියණිය සමග ඔහු තනිවිය. තම දියණිය යථාතත්වයට පත්කිරීම ඥාතිනට සහ පාසැලේ මිතුරියනට පැවරූ ලෙස්ලිට වෘත්තිය සමිති නායකයෙකු වශයෙන් විශාල වගකීම් සම්භාරයක් ඉටුකිරීම සඳහා දිවා රෑ වෙහෙසීමට සිදුවිය. අනතුරෙන් තුවාල වූ අයට නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම, විපතට පත්වූ අයගේ ඥාතීනට වන්දි ප්‍රදානය, මෙන්ම විසිරී ගිය මහබැංකුව යලිත් එක්වහලක් යටට ගෙන ඒම මේ අතර ප්‍රධාන විය. ප්‍රහාරයෙන් භීතියට පත්වූ ඇතැම් කොටස් ප්‍රකෘති තත්වයට ගැනීම ඉතා අසීරු විය.

සිය වෘත්තිය සමිති වගකීම ඉටුකරන අතරතුරම විපතට පත්වූ අවස්ථාවේ දී උදව් උපකාර කළ අයට කෘතවේදීත්වය පලකිරීම කෙරෙහි ද ඔහුගේ අවධානය යොමුවිය. තම දියණිය අස්වැසීමට අසීමිත මෙහෙයක් ඉටුකළ විශාකා විදුහලේ විදුහල්පතිනියටත්, සඳමාලි දියණියගේ යෙහෙලියන්ටත් කෘතවේදීත්වය දැක්වීම් වස් තමා සතුව තිබූ මුදල් වියදම්කර දෙමහල් විවේකාගාරයක් තනවා පාසැලට පරිත්‍යාග කළේය. ගොඩනැගිල්ල භාර දීම සිදුවූයේ ලෙස්ලි රණසිංහ මහතා අතින් නොව මහබැංකු අධිපති අමරානන්ද ජයවර්ධන මහතා අතිනි.

1996 මහබැංකු බේදවාචකයෙන් විපතට පත් අයගේ ජීවිත බේරාගැනීමට කොළඹ ජාතික රෝහල ඉමහත් පරිශ්‍රමයක් දැරීය. මේ කාලයේදී ජාතික රෝහලේ ස්නායු ශල්‍ය වෛද්‍ය ඒකකය M.R.I. ස්කෑනින් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා

ආධාර ව්‍යාපෘතියක් ආරම්භකර තිබුනි. ලෙස්ලි වහාම ක්‍රියාත්මක වී මහ බැංකුවේ සේවක කොටස් දිරි ගන්වා ආධාර එකතුකර ලක්ෂ 07ක මුදලක් මෙම ව්‍යාපෘතියට පරිත්‍යග කරන ලදී. ස්නායු ශල්‍ය වෛද්‍ය ඒකකයේ පිහිටුවා ඇති ඵලකයක මෙම පරිත්‍යාගය ගැන සඳහන්වේ. මෙම මුදල් පරිත්‍යාගය රාජගිරිය මහබැංකු පරිශ්‍රයේ දී සිදුවූ අතර චෙක්පත භාර දීම සිදුවූයේ ලෙස්ලි අතින්නොව බේදවාචකයෙන් තුවාල ලත් මහ බැංකු නිලධාරිනියක් අතිනි.

වන්දි ලබාගැනීම, වෙනත් මූල්‍ය ආධාර ලබාගැනීම මෙන්ම වඩා වැදගත් කාර්යයක් වූයේ මහ බැංකුව යලිත් එක්වහලක් යටතේ නැවත ස්ථාපනය කිරීමය. මෙය කාලීන ජාතික යුතුකමක් විය. නමුත් බියෙන් තැතිගත් අය මෙම ප්‍රයත්නයට එතරම් සහයෝගයක් දැක්වූයේ නැත. ලෝක වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල තුළ මහබැංකුව යලි පිහිට වීම කෙරෙහි. අකමැති වූ අයගේ බලපෑම් ප්‍රයෝජනයට ගත්පිරිසක් මේ අතරතුර ලෙස්ලි රණසිංහ මහතා වෘත්තීය සමිති සභාපති ධුරයෙන් ඉවත් කරන ලදී. ඉන්පසුව වුවද ලෝක වෙළඳ සංකීරණ ගොඩනැගිල්ල තුළ මහබැංකුව ස්ථාපන කිරීම නියමිත පරිදීම සිදුවිය. නමුත් පාලන අධිකාරිය සමග සහයෝගයෙන් කටයුතු කර ලබාගතහැකිව තිබූ වරප්‍රසාද රාශියක් අපට අහිමිවී ගියේය.

මහ බැංකුවෙන් විශ්‍රාම ගිය පසු ලෙස්ලි "ඉන්ද්‍රබීලය" නම් සංවිධානය පිහිටු වීය.මෙහි පරමාර්ථය වූයේ මහ බැංකු බෝම්බ ප්‍රහාරය සිදුවූ ජනවාරි මස 31 වන දින සමාජ සත්කාරයක් කොට එහි පින 1996 බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත්වූවනට අනුමෝදන් කර වීමය. මෙහි ආරම්භක පියවරක් ලෙස සිය සාමාජිකයන් පිරිසක් සමග දඹදිව වන්දනාවක් සංවිධානය කළේය. රන් කරඬුවක් නිමවා එය සැවැත් නුවර ලංකා රාමයට පුජා කළේය. අදත් සැවැත් නුවර ලංකාරාමයට ගිය අවස්ථාවක මෙම කරඬුව හිසමත රඳවාගෙන අශීර්වාද ලබාගත හැකිය. අනුරාධපුර මහරෝහලේ මාතෘ වාට්ටුව පිලිසකර කළ ඉන්ද්‍රබීලය" අනුරාධපුර රුවන්වැලි මහසෑය මලුවේ ආලෝක පුජාවක් පවත්වා මියගිය අයට පිං අනුමෝදන් කළේය. තවත් විටක තන්තිරිමල ප්‍රදේශයේ වෛද්‍ය සායනයක් පැවැත්වීය. මදුනාගල ආරණ්‍ය සේනාසනයේ දානශාලාව ප්‍රතිසංස්කරණය කළේය. බඩල්කුඹුර වරාදොල ප්‍රදේශයේද වෛද්‍ය සායනයක් පවත්වන ලදී.
හම්බන්තොට දිස්ත්‍රිකයේ තණමල්විල, අගුණුකොළ වැව ගමේ අත්හැර දමා තිබූ "වෙදාරැක්ක වැව" ප්‍රතිසංස්කරණය කිරීමට ද ලෙස්ලිට හැකියාව ලැබුනි. මේ සඳහා රුපියල් දසලක්ෂයක පමණ මුලදක් පළමුව සොයාගැනීමට සිදුවිය. මෙහිදී ඉන්ද්‍රබීලය" බලවත් මුදල් අර්බුදයකට මුහුණ දුන්නේය. අරමුදල තරකර ගැනිමට කොළඹ ජෝන්ද සිල්වා රඟහලේ සාරංගා නැවෙන් ඇවිත් " නම් ප්‍රසාංගික නාට්‍ය වේදිකා ගත කර ප්‍රතිපාදන සොයා ගැනීමට සිදුවිය. එම මුදලත් ප්‍රමාණවත් නොවූ විට ලෙස්ලි තම මෝටර් රථය උගස්කර මුදල් ලබාගත්තේය. එවැන්නක් හිතවතුන් දැනගත්තේ දෙවැනි වර රථය උගස් කිරීමට ගිය අවස්ථාවේදීය. වෙදාරැක්ක වැව ප්‍රතිසංස්කරණය කිරීමේ පලමු පස්පිඩැල්ල කැපුවේත් වැව බාර දීම සිදුකලේත් ලෙස්ලි අතින් නොව මහබැංකු අධිපති අමරානන්ද ජයවර්ධන මහතා අතිනි.

වෙදාරැක්ක වැව" ඉස්මත්තේ පිහිටුවා ඇති ඵලකයේ සටහන් කිරීමට ලෙස්ලි අනුමත කළේ පහත දැක්වෙන වාක්‍ය කොටසයි.

**වෙදාරැක්ක වැව**
**සුනිල් දියවරින් පිරී**
**විකසිත වූ පස් පියුමින් මනරම්ව**
**මිනිසුන් මතු නොව සතා සිපාවා ද**
**ගහ කොළ ද වන පෙත ද**
**සිහිලැල් පවනින් පමුදිතව ඉසිඹුලන**
**වාරයක් වාරයක් පාසා**
**නැගෙන්නා වූ ප්‍රීතිප්‍රමෝදය**
**එදා ශ්‍රී ලංකා මහ බැංකුවේ**
**ඛේදවාචකයෙන්**
**විපතට හා දුකට පත් සදාදරණීය සහෘද කැළට**
**නිරන්තර වූ අමාශාන්ති ප්‍රවාහයක් වේවා**
**යන පරම පවිත්‍ර චේතනාවෙන් යුතුව**
**මෙම වැව් කෝමළිය**
**මිලිනව ගිය රුහුණු අසිරිය යළි පුබුදුවා ගැනිමට**
**අපරිමිත මෙහෙයක යෙදෙන**
**තණමල්විල අගුණ කොළ වැව ගම**
**ගොවි ජනතාවගේ දිරිය දැතට පිරිනමම් හ."**

වෙදාරැක්ක වැව ප්‍රතිසංස්කරණ කටයුතු වලදී ඉන්ද්‍රබීලය" මෙහෙයුම් කණ්ඩායම ලැගුම් ගත්තේ තිරාණගම රතනසාර බෞද්ධ මධ්‍යස්ථානයේ අබලන් ගොඩනැගිල්ලකය. ඉන්ද්‍රබීලය" මෙම විහාරස්ථානය ද ප්‍රතිසංස්කරණය කර දෙන ලදී.

මීට පෙර වෛද්‍ය සායනයක් පැවැත්වූ බඩල් කුඹුර ප්‍රදේශයට නැවත වතාවක් ගිය ඉන්ද්‍රබීලය" එවර ගල්ලහ අශෝකාරාමයේ සිගිති පාසලට ගොඩනැගිල්ලක් සාදා පරිත්‍යාග කරන ලදී.

අංගොඩ මානසික රෝහලේ දරුණු අමතක වීම නොහොත් ඩිමෙන්ශියා" රෝගයෙන් ඔත්පලව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ වාට්ටුව ප්‍රතිසංස්කරණය කොට තවත් අඩුපාඩු රැසක් සපුරා දීමට ඉන්ද්‍රබීලයට" හැකිවිය. 2007 වසරේදී රුපියල් ලක්ෂ 10ක් පමන වියදම් කර මහරගම පිලිකා රෝහලේ ළමා වාට්ටුව ප්‍රතිසංස්කරණය කරන ලදී.

දිවංගත මාහාචාර්ය නන්දසේන රත්නපාල මහතා විසින් අරම්භ කරන ලද මීගොඩ සංහිඳ" ළමා නිකේතනයේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා විශාල කාරය භාරයක් සිදුකළ අතර එම දරුවනට පුස්තකාලයක් ද සාදා පරිත්‍යාග

කරන ලදී. එම පුස්තකාලය හැඳින්වුයේ ලෙස්ලි රණසිංහ මහතාගේ නමින් නොව ආචාර්ය එච්.එන්.එස්. කරුණාතිලක මහතාගේ නාමයෙන්ය. ලෙස්ලි දෙවනි වතාවට සිය රථය උගසට තබන්නේ මෙම අවස්ථාවේදීය. අදාල මුල්‍ය ආයතනය මේ කරුණ පිළිබඳ විපරම් කරද්දී ලෙස්ලි තත්ත්වය පැහැදිලි කර දුන්නේය. එහි ප්‍රතිඵලය ලෙස එම ආයතනය ද සංහිඳ" ළමානිකේතනයට ආධාර කිරීමට ඉදිරිපත් විය.

ලෙස්ලිගේ නායකත්වය යටතේ ක්‍රියාකල ඉන්ද්‍රබීලයට" හොඳ සමාජ ප්‍රතිචාරයක් ලැබුනි. එමනිසා 2008 වසරේ දී. සූර්ය ලංකා" පදනම මගින් ලෙස්ලිට ආත්මාර්ථය ඉක්ම වූ වීර්ය පාරමිතාවේ අභිමානය" නම් තිලිණය ප්‍රදානය කරන ලදී.

ලෙස්ලි තම ඉන්ද්‍රබීලය" සංවිධානය මගින් 1996 වර්ශයේ සිට 16 වතාවක් නොයෙක් සමාජ සත්කාර සිදුකරන ලදී.ඉන්ද්‍රබීලයේ" ගරු සභාපති ධුරය හොබවන අතර තුරම ඔහු මහ බැංකු විශ්‍රාමික සංගමයේ ද ගරු සභාපති ධුරයට පත්විය. අවුරුදු 3ක් ඔහු මෙම ධුරය හොබවන ලදී. විශ්‍රාමිකයින්ගේ අඬහැරය වූ සැදෑව" සඟරාව කරලියට එන්නේ ඔහුගේ ආශිර්වාදයෙනි. නමුත් ඔහු කිසිවිටකවත් සඟරාවේ සංස්කරණ කටයුතුවලදී සංස්කාරක වරයාට උපදෙස් දෙන්නට ගියේ නැත. සාමාජික මුදල රු100 දක්වා වැඩිකර ගැනිමටත් සාමාජිකයෙකුගේ අභාවයකදී දෙනු ලබන ආධාර මුදල රු 25000 දක්වා වැඩිකිරිමටත් ඔහුට හැකිවිය. විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්න කෙරෙහි මහ බැංකුවේ අවධානය යොමුකරවා ගැනීමට ඔහු විශාල පරිශ්‍රමයක් දැරීය.

මේ අතර තුර දඹදිව කොසඹෑ නුවර විහාරස්ථානය නැවත ගොඩනැංවීමේ කාර්යට අතගසා තිබු සංවිධානයේ භාණ්ඩාගාරික ධුරය ද ලෙස්ලි හොබවනු ලැබීය. මිය යන්නට මාස කීපයකට කලින් හිත මිතුරන් සමඟ එක්වී සංවර්ධන කටයුතු සඳහා ආධාර මුදලක්ද පිරිනැමීය. කොසඹෑ නුවර විහාරස්ථානය ඉදිවු පසු එය සියැසින් දැක ගැනිමට ඔහු මහත් බලාපොරොත්තුවෙන් සිටියේය.

කෙසේ වෙතත් ලෙස්ලිට නිම කර ගැනීමට නොහැකි වු කාර්යය දෙකක් ඉතිරි විය. පළමු වැන්න ඉන්ද්‍රබීලයේ පිංපොත" ලියා එළිදැක්වීමට තිබු බලාපොරොත්තුවයි. දෙවැන්න මහ බැංකුවෙන් විශ්‍රාමගිය පැරණි එසේම තම දුක කියාගැනීමටවත් ශක්තියක් නොමැති විශ්‍රාමික පිරිසට යම් සාධාරණයක් ඉටුකර ගැනීම කෙරෙහි මහ බැංකුවේ අවධානය යොමු කර වීමය. ඔහු ඔත්පලව සිටි මොහොතේ යම් යම් කරුණු කාරනා එක්රැස් කරමින් ලියවිල්ලක් සකස් කිරිමට කටයුතු කළේය. නමුත් එය නොනිම් ලියවිල්ලක් විය.

ලෙස්ලි කිසිවිටකත් ප්‍රසිද්ධිය හබා නොගියේය. මහ බැංකු විශ්‍රාමික අත්පොතට ද ඔහු තම ඡායාරූපය ලබා නොදුන්නේය. ඔහු විශාල වැඩකොටසක් සිදුකොට නිහඬව නික්ම ගියේය. එම උතුම් ගුණයට ගරුකිරීමක් වශයෙන් ඉන්ද්‍රබීලයේ සමාජ සත්කාර වැඩ සටහන් අවසානයේ පසුබිමින් වාදනය වූ ඔහු ප්‍රියකළ ගීතයක පද දෙකක් පමණක් මෙම සටහනේ සිරසට යොදා ඇත.

**දයාබර ලෙස්ලි අපි ඔබට නිවන් සුව පතමු.**



**බන්දුල විමලසූරිය (938)**
**0112 840305**

## - ලෙස්ලි රණසිංහ නම් ඔහු ! -

**දෑතේ සවිය යුක්තියටයි එකතු වුනේ**
**පරිකල්පනාවට යට කළ දේ පෙනු නේ**
**යහගුණ වඩ වඩා දහමට කැප කෙරු නේ**
**නිහඬව කළ දේට මේ පැදි වැල් පිදුනේ**

**දැක්ම හරි ගැඹුරු යි**
**තර්ක හරි තියුණු යි**
**පෑන හරි ප්‍රබල යි**
**හැමට සම සමව යි**

**- සංස්කාරක -**



# ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කාන්තා සංසදය

**ව**සර තිස් ගණනක් පවුලේ සාමාජිකයින් ලෙස ඇසුරු කළ බොහෝ දෙනෙක් විශ්‍රාම ගැනීමෙන් පසුව එකිනෙකා ඈත්වී ජීවත් වීමට කැමැත්තක් නොදැක් වූහ. යම් යම් අවස්ථා වලදී අප එකිනෙකා මුණ ගැසුනත් දුරකථන මගින් නිතර නිතර හමු වුනත් අප එකමුතු වී කුඩා සංවිධානයක් ඇති කර ගතහොත් අපට මුණ ගැසීමටත් කිසියම් ප්‍රයෝජනවත් කාර්යයක් ඉඳහිට හෝ කිරීමටත් හැකි වනු ඇතැයි අපි අදහස් කළෙමු. මේ පිළිබඳව නිතර සාකච්ඡා කරමින් සිටියෙමු. ලතා දයාවංශ මහත්මිය ඒ ගැන මහළනන්දුවක් දැක්වූවාය. ඇය ඒ සඳහා දිරි ගන්වමින් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට උපරිම සහයෝගය ලබා දුන්නාය. ඇය බොහෝ වෙහෙස වී ගොඩ නගා ගෙන යන කටයුත්තට ඇගේ පවුලේ උදවිය ද නොයෙක් ආකාරයෙන් උදවු උපකාර කලහ. අන්තිමේදී 2007. 09.09 වන දින බෞද්ධාලෝක මාවතේ බෞද්ධ කාන්තා සංගම් ශාලාවේදී විශ්‍රාමික සොහොයුරියන් 43 දෙනෙකුගේ සහභාගිත්වයෙන් **ශ්‍රී ලංකා මහ බැංකු ජ්‍යෙෂ්ඨ කාන්තා සංසදය** පිහිටුවා ගන්නා ලදී. එහි සභාපති වශයෙන් ලතා දයාවංශ මහත්මියම පත් වූවාය. ඇයට සහය වීමට උප සභාපති වශයෙන් මා පත්කර ගන්නා ලදී. එදින සිට අපි එකමුතු වී විශාල වැඩ කොටසක් ඉටු කලෙමු.

1996 ජනවාරි 31 දින සිදු වූ අවාසනාවන්ත සිද්ධියෙන් ආබාධිත තත්වයට පත්ව නිවෙස් වලට වී සිටින අප සොයුරු සොයුරියන් මෙන්ම, වයස්ගත වීම නිසා නිවෙස් වල සිටින අපේ සොයුරු සොයුරියන් ද හමුවී දුක සැප බැලීමටත් ගියෙමු. අපගේ කාරක සභා රැස්වීම් පැවැත්වීමත්, සංවත්සර රැස්වීම් පවා පැවැත්වීමටත් අයිරා වැගොඩපොල මහත්මිය ඇගේ නිවසේ ඉඩ කඩ ලබා දී අපට විශාල සේවයක් කළාය. එය අප සැවොම අගය කළ යුතුය.

දයාවංශ සොයුරිය ඉතා ආශාවෙන් තවත් කටයුත්තකට අත ගැසුවාය. ඒ බැංකු බෙදවාචකය සිදු වූ දිනයේ අප එකිනෙකා මුහුණදුන් අත්දැකීම් පිළිබඳව ලියැවුණු ලිපි එකතුවක් පොතක් වශයෙන් එළි දැක්වීමටය. ඇයගේ ආරාධනයෙන් කවුරුත් තම අත්දැකීම් ලියා එවූහ. අප සොයුරියන්ට අමතරව වෙනත් සොයුරියන් කිහිප දෙනෙක් ද ලිපි ලියා එවූහ. දයාවංශ සොයුරිය දිවා රෑ වෙහෙස වී අන් අයගේ ද සහායෙන් ''**මහ ගෙදර කඳුළු**'' නමින් එම කෘතිය 2008. 11. 29 වන දින එළිදැක්වූවාය. ඇගේ අප්‍රතිහත ධෛර්ය නිසා අඩු පාඩු ද සහිතව වුවත් එම කෘතිය අනගි ආභරණයක් විය. සංසදයෙන් තවත් බොහෝ කටයුතු ඉටු කළ බව ප්‍රකාශ කළ යුතුය. අප විශ්‍රාමික ජේ. ජයවර්ධන මහතා විසින් ලියන ලද කෘතියක් එළි දැක්වීමේ කටයුත්තට වත්තල ප්‍රදේශයේදී අපි සහභාගි වුනෙමු. තවද අප සංසදයේ සොයුරියන්ගේ දක්ෂතා එළි දැක්වීමේ ගායන හා නර්තන ප්‍රසංගයක් ද රාජගිරිය බැංකු ශාලාවේදී පවත්වන ලදී. ඒ සඳහා විශාල පිරිසක් සහභාගි වූහ. එපමණක් නොව ධර්ම දේශනා ද සංවිධානය කළෙමු. උතුරේ මානුෂික මෙහෙයුම් වලින් තුවාල ලබා පොළොන්නරුව රෝහලේ නේවාසිකව සිටි රණ විරුවන්ට අවශ්‍ය කරන භාණ්ඩ පරිත්‍යාගයක් ද සිදු කළෙමු. හදිසියේ ආබාධිත තත්වයට පත් වූ සමිතා සමන්මලී ශිෂ්‍යාවට ද මුදල් පරිත්‍යාගයක් කළෙමු. දිඹුලාගල, කුඩා වැව, කෙත්තාරාමයේ දහම් පාසල් දරුවන්ට පාසල් උපකරණ පරිත්‍යාගයක් ද ගම් වාසීන්ට ඇඳුම් පැළඳුම් වියලි අහාර ආදිය ද පරිත්‍යාග කළෙමු. ඊට අමතරව තවත් බොහෝ දේ සිදු කිරීමට අපට අවස්ථාවක් සැලසිණ. මෙසේ විශාල වැඩ කොටසක් ඉතා සතුටින් ඉටු කරමින් සිටි දයාවංශ සොයුරිය හදිසියේම අප අතරින් වෙන්ව ගියාය. ඇත්තටම කාන්තා සංසදය යනු ලතාය. ලතා යනු කාන්තා සංසදය යැයි අපි විශ්වාස කලෙමු. ඒ තරමටම ඇය ඒ වෙනුවෙන් ඇප කැපව සිටියාය. තවත් ඉටු කිරීමට බොහෝ දේ සිතේ තිබෙන බැවින් මට නොවරදවාම ඇය හමුවන ලෙස ඉල්ලා සිටියාය. හමු වීමට පෙර ඇය රහසේම අපෙන් සමු ගත්තාය. අප සංගමය ඉදිරියට ගෙන යෑම ඇයට කෙරෙන ගෞරවයක් ලෙස අපි සැලකුවෙමු. සාමාජිකාවන් 43 දෙනෙකුගෙන් පටන් ගත් මෙම සංසදය දැනට සියයක පමණ පිරිසක් සාමාජිකත්වය ලබා සිටිති. දැනට එහි සභාපති වශයෙන් මානෙල් ජයසේකර මහත්මිය ද ලේකම් වශයෙන් බර්නි ප්‍රනාන්දු මහත්මිය ද, භාණ්ඩාගාරික ඉන්ද්‍රානි වෙහෙරගොඩ මහත්මිය ද කටයුතු කරති. උප සභාපති රාණි මූණසිංහ මහත්මිය ද, උප ලේකම් ජයන්ති ලීලාරත්න මහත්මියද, උප භාණ්ඩාගාරික චන්ද්‍රා වක්වැල්ල මහත්මිය ද පත්ව සිටිති. නිහඬව විශාල සේවාවක් ඉටු කරන අප කාන්තා සංසදයට අළුතින් විශ්‍රාම යන කාන්තාවන්ට සාමාජිකත්වය ලබා ගන්නා ලෙසත්, එම සංගමය ඉදිරියට ගෙන යෑමට සහයෝගය දෙන ලෙසත් ආරාධනය කරමි.


**- හේමා විමලසෝම -**

**(646)**

**0112 614717**

**071 8328627**




# BRITISH JUSTICE AT WORK

With the kind permission of the Asst.Commissioner of Archives in Kandy was possible to peruse the records in their possession to see the General Order issued by the British Governor Robert Brownrigg in 1818 to put down the rebellion in Uva - Wellassa during the Britishcolonial rule in Sri Lanka (then Ceylon) The General order ran as follows.

"kill every man, woman and child including the babes suckling at their mother's breast. Destroy all dwelling houses. Burn all crops. Cut down all fruit trees, Slaughter all cattle, take what meat is necessary to feed the troops and burn the rest. Destroy all reservoirs canals and channels. poison the well' Lay waste utterly the country side denying any relief whatsoever to the rebels."

This order was carried out laying waste Uva wellassa a destruction from which it is yet to fully recover.

British writers commented that every tree from Ratnaoura to Badulla was devastated with hung bodies of rotting human beings, that gave off a revolting stench. The word genocide was coined in the 1940's meaning the wiping out of people, but, if this wasn't genocide then, what is? this is the manner in which the British and their western allies who have now become human right crusaders against Sri Lanka dealt with a reellion by the Sri lankan people at that time.

Imebecility of men invite impudence of power.


**Parakrama Jayasuriya**
**(815)**
**081 2570780**



# *In what way is it a suffering not to have one's wishes fulfilled?*

Appearance

Most men would like to be hand some tall with a mascular body; Most woman would like to be beautiful tall with an attractive figure; Yet only a veery small minority obtain such qualities.
Every one would like to be free from physical defects, yet some are born with a disfigured face, limbs and body some are hairless, hair lipped or with defective sexual organs. Some have un sighty birth marks skin dis colouration, foul body odour, bad breath, Sweaty palms a rough voice, pimples, freckles, rough skin, unsighty body hairs etc.




**D. E. Abeyweera**
**(507)**
**0112-913901**

# සමානාත්මතාවයට ගරු කරමු.

අප තිලෝගුරු බුදුන් වහන්සේ දෙසූ පරිදි සියලු ලෝක සත්වයාම සමානව සැලකීමට පුරුදු වීම යහපත් මනුෂ්‍ය ගුණාංගයක්. මිනිසත් බව ලබා උපත ලබන අප මනුෂ්‍යයන් ලෙස ජීවත් වීමට නම් ඔවුනොවුන් අතර සාමානාත්මතාවය නැමැති ගුණදහමට ගරු කිරිමට පුරුදු විය යුතුයි. එසේ වුවද වර්තමාන සමාජයේ ජීවත්වන මනුෂ්‍යයන් ජාති ආගම් කුල ගෝත්‍ර වලට බෙදී එකිනෙකා අතර ඇති සුහදතාවය පලුදු වන අයුරින් ජීවත් වීමට පුරුදු වී සිටියි. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ මනුෂ්‍යත්වයට පවා කැළලක් වන පරිදි හැසිරීමට නැඹුරු වීමයි. විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ මෙම ගුණධර්මයට පටහැනිව ක්‍රියාකිරීම නිසා වර්තමාන සමාජීය මුහුණුවරට මහත් කැළලක් වී ඇත. ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ පටන් මේ දක්වා සමානාත්මතාවය නැමැති ගුණ ධර්ම අමතක කරමින්, එකිනෙකා අභිබවා යමින් සමාජයේ වෙසෙන මිනිසුන් කෙනෙක් උසස් කොට සළකා කෙනෙක් පහත් කොට සැලකීමට පුරුදු වීමේ ප්‍රතිඵලය වී ඇත්තේ මේ සමාජීය මුහුණුවරට කැලලක් වීමයි. එම හැසිරීම නිසා වර්ථමාන දේශපාලන තත්වයට ද යම් බලපෑමක් සිදුවීම බලාපොරොත්තු විය හැකි ප්‍රතිඵලයකි.

මේ නිසා අි මනුෂ්‍යත්වයට ගරු කරන මිනිසුන් ලෙස සමානාත්මතාවය නැමැති ගුණධර්මය අවබෝධ කරගනිමු. මිනිස්කමට ගරුකරන, සියලු ආගම්වලට ගරුකරන කොටසක් ලෙස දැන්වත් පෙළ ගැසෙමු. විශේෂයෙන් බුදු දහමට ගරු කරන අපි සමානාත්මතාවයට ප්‍රමුඛත්වය දී කටයුතු කිරීමට සැලකිලිමත් වෙමු.



**චාලට් දසනායක - 3124**
**-0715172973, 0112912171**

# දයාබර කරු ....



මොණරාගල, දොඹගහවෙල, ලියන්ගොල්ල ග්‍රාමයේදී, 1947 ජුනි 28 වැනි දින දිසානායක මුදියන්සේලාගේ කරුණාසේන දිසානායක නමින් ජන්ම ලාභය ලද මේ කුමරු දොඹගහවෙල විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපන ලබා එවකට පැවැති පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්ව පස්සර හා බිබිල මධ්‍ය මහා විද්‍යාලයන්ට ඇතුළුවේ. එහි දීප්තිමත් සිසුවෙකු වශයෙන් 1965 දී කොළඹ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට ඇතුළත්ව කලා විෂය ධාරාවෙන් උපාධිය ලබා, 1967 අගෝස්තු 01 වෙනි දින ශ්‍රී ලංකා මහ බැංකු සේවයට අනුයුක්ත විය.

වර්ෂ 1974 නොවැම්බර් 03 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේම නිලධාරිණියක වූ නන්දනී ජයලත් මෙනෙවිය සමග විවාහ දිවියට ඇතුළු වූ කරු දයාබර පුතුන් දෙදෙනෙකුගේ හා දියණියකගේ සෙනෙහෙබර පියෙකි. පියාගේ අභ්‍යාසයෙන් ලත් සහජ හැකියාවන් ඔප් නැංවූ පුතුන් දෙදෙනා ක්‍රිකට් ක්‍රීඩාවෙන් මෙන්ම රග්බි ක්‍රීඩාවෙන් ද කොළඹ ශාන්ත පීතර විද්‍යාලය නියෝජනය කරන ලදී. දියණිය බැඩ්මින්ටන් හා හොකී ක්‍රීඩා ඉසව් තුළ කාන්තා විද්‍යාලය නියෝජනය කළාය. ක්‍රීඩාවට මෙන්ම අධ්‍යාපන කටයුතු සඳහා ද එකසේ දස්කම් පෑ දරුවන් තිදෙනා විදේශ සරසවි තුළින් අධ්‍යාපනය ලබා දේශීය හා විදේශීය උසස් රැකියාවන්හි නියුතුව සිටීම, නැසීගිය දයාබර පියාණන්ගේ හා සුජීවත්ව සිටින දයාබර මෑණියන්ගේ ද අමන්දානන්දයට හේතු වූවාට කිසිදු සැකයක් නැත. දයාබර සැමියෙකු හා ගුණගරුක පියෙකු වශයෙන් කරු ස්වකීය පවුල වෙනුවෙන් කළයුතු යුතුකම් නොපිරිහෙළා ඉටුකළ ශ්‍රේෂ්ඨ මිනිසෙකි.

කොළඹ සරසවියෙහි සිප්සතර හදාරා එමගින් ලබාගත් දැනුමත්, පාසල් දිවියේ සිට ප්‍රගුණ කළ ක්‍රීඩා කෞෂල්‍යයන් තුළින් ලබාගත් එඩියත් වඩාත් කාලෝචිත මගකට යොමු කරමින් මාතෘ භූමියට අවශ්‍යයෙන්ම ඉටු විය යුතු යුතුකමක් ඉටු කිරීමේ උදාරතර අරමුණින් වාම දේශපාලනයට පිවිසි කරු 70 දශකයේ මුල් භාගයේ ලක්ෂ්මන් කනතිගොඩ, පියදාස රත්නායක, කමල් ද සිල්වා, පියසේන පට්ටිආරච්චි, පාලේන්ද්‍ර රත්නවීර, ක්‍රිස්ටි ගුණසේකර, සුදත් ජයසූරිය, එච්. පී. ඒ. ජයසිංහ, කේ. ප්‍රේමචන්ද්‍ර, පී. අරුන්දවනාදන් සහ ඉන්දික ගුණවර්ධන යන සොහොයුරන් සමඟ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සමිතියක් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පිහිටුවීමට පුරෝගාමී විය. 1980 මහා සේවක වැඩ වර්ජනයට මහ බැංකුවේ නායකත්වය සැපයූ තුල්සිරි අන්ද්‍රාදි, චන්ද්‍රසේන වෙදගේ, රොනල්ඩ් ගුණතිලක හා එච්. චන්ද්‍රසෝම ඇතුළු සොහොයුරන් සමඟ සක්‍රීයව දායක වූ කරු මහ බැංකු සේවයෙන් පහ කරනු ලැබීමට ද ලක් විය.

වර්ජනයට සහභාගි වී රැකියාව අහිමි වූ සොහොයුරන්ගෙන් ඇතැමෙක් දරිද්‍රතාවයට පත්ව ජීවිත විනාශ කරගත් කාල වකවානුවක කරු ආධාර පතා කිසිවෙකුට අත පෑවේ නැත. සහජ දක්ෂතාවයන්ගෙන් හා නොපසුබට උත්සාහයෙන් පිරිපුන් කරු දේශ දේශාන්තරයන්හි සංචාරය කරමින් මෝටර් රථ අමතර කොටස් ආනයනය කරමින් ව්‍යාපාරයක් අරඹා දයාබර බිරිඳත්, සෙනෙහෙබර දරුවනුත් කිසිදු අඟහිඟතාවයකින් තොරව පෝෂණය කොට ජීවත් කරන ලද අතර, ව්‍යාපාරය තුළින් තමා ලත් ආදායම් අතිරික්තය අවශ්‍යතාවය මත තම සහෝදර වර්ජකයන්ට බෙදා දීමට ද කාරුණික විය.

තමා උපන් ගම් ප්‍රදේශයේ මෙන්ම ජීවත් වූ කොළඹ අවට ප්‍රදේශයේ ද, සේවය කළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ද සෑම තරාතිරමකම සාමාන්‍ය, මිනිසුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ කරු සැබෑ මිනිසෙකු ලෙස ජීවත් වී ඔවුන්ගේ දුකේදී මෙන්ම සැපේදී ද උරෙනුර ගැටී සැමට පිහිට වූ උදාරතර මිනිසෙකි. මානව හිතවාදියෙකි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික සේවයෙන් විශ්‍රාම ලද අප දයාබර සොයුරු කරු දිසානායක මහතා ජීවිතයෙන් ද සමු ගෙන 2015. 01. 28 වන දිනට පුරා වසරක් සපිරෙන බව සහෘදයන් වෙත දන්වා සිටින්නේ, බලවත් සංවේගයෙනි. අප විශ්‍රාමික සංගමයේ ද, උද්‍යෝගිමත් සාමාජිකයෙකු වූ කරු, විශ්‍රාමයට පෙර සක්‍රිය සේවයේ යෙදී සිටියදී, ශ්‍රී ලංකා මහ බැංකු සිංහල සංස්කෘතික සංගමයේ මෙන්ම ක්‍රීඩා සාමාජයේ ද විවිධ නිලතල හොබවමින් එහි ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් මහබැංකුව තුළ සංස්කෘතික පුනර්ජීවනයක් ඇති කිරීම සඳහා පුස්තකාලයක් ඇරඹීම, වාර්ෂික ගී පද්‍ය ගායනා හා රචනා තරග පැවැත්වීම වැනි විවිධ ප්‍රාසංගික ඉසව් දියත් කිරීමට ද මූලිකව ක්‍රියා කරනලදී. ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ ද, කැපී පෙනෙන ක්‍රීඩකයෙකු වූ කරු අත් පන්දු, මේස පන්දු හා මළල ක්‍රීඩා අංශයන්ගෙන් අන්තර් බැංකු, රාජ්‍ය සේවා හා ක්‍රීඩා සමාජ තරගාවලීන් වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කළ අතර වර්ෂ ගණනාවක් නොකඩවා මහ බැංකු මේස පන්දු ශූරතාවය තමා සතු කර ගැනීමට සමත් විය. ඔහු කොළඹ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ද ක්‍රීඩා වර්ණ ලාභියෙකි.

යුක්තිගරුක කාරුණික මහත්මයෙකු වශයෙන් හඳුන්වා දිය හැකි කරු දිසානායක අද අප අතර නැති වුවත්, ඔහු විසින් තබන ලද මතක සටහන් සදා මතකයේ රැඳෙණු ඇත.ඔහුට අවසන් බුහුමන් දැක්වීමට සපැමිණි කෘතගුණදත් මහා සහෘද ජනතාව මෙයට කදිම නිදසුනකි.

සොහොයුරාණෙනි, ඔබට නිවන් සුව !



**- කමල් ද සිල්වා - (1113)**
**0112 820849**
**071 4426687**

## නොසැබි පියාගෙන් පුතුට ඔවදන්

ගෙවමින් තුරුණු විය මැදිවිය ඉවර කර
එලඹෙන සැඳෑවිය මරණය පෙනෙන දුර
කැඳවා සිය පුතුන් පියතුම කුළුණු බර
පවසයි මෙසේ සිය දිවි මඟ මෙනෙහි කර

පෙම්බර පුතුනි මගෙ ඔබ පිය පදවි හිමී
මේ දිවි ගමන වනු ඇති මතු දිනක නිමී
කිව යුතු කරුණු ඇත හද සෙනෙහසිනි තෙමී
දෙනු මැන සවන් සුසැදී මා වෙතට නැමී

පෝදින ඇසුන මුත් අරමෙහි වැයෙන බෙර
නොගියෙමි වෙහෙර බෝරුකවත් පෙනන දුර
වෙනදා පුරුදු ලෙස විලිබිය ඉවත හැර
එදිනත් ගියෙමි මත්පැන් හල වෙතට හොර

විලිබිය ගති සිරිත් සැම කරමින බංගා
සතියට දෙතුන්වර මම අසුපිට නැංගා
කණ කර ඔබේ මවගේ ඉණයට හංගා
මතකයි උගස් පොළ වෙත ගියහැටි රිංගා

මතකයි තැබෑරුම වෙත ගිය ගමන කෙටී
බීගත් දිනෙක සිටියා මග අසල වැටී
උඹටත් මැණියන්ටත් මම තලපු හැටි
මෙහි දිවි ගෙවෙන තුරු උඹලට මතක හිටී

දුකකින් ලැබිය යුතු මහ වරමකට සරී
මිනිසත් බවය ලියුමකි රොන් සුවඳ පිරී
බැලුවොත් මගෙ දිවිය ආපසු දෙසට හැරී
අනුකරණයට නිසි යයි මට කියනු බැරී

පුත ඔබ දිනෙන් දින ගුන නුවණින් මේරේ
පින්-පව් හොඳ නරක දැන් ඔබහට තේරේ
ඇතැමෙකු කියනමුත් ආරේ ගුණ නෑරේ
කිසි දින නොයන් ඔබ පියතුම ගිය පාරේ



- පියදාස වත්තේගම -(451)
(0112 864505)

## On Sigiriya



In grim silence the remains lay
All over the kingdom of olden day
Where king kashyapa reigned
During the short protection he gained
Atop the rock fortress of Sigiriya

Battered foundations every where lie
Yet holding bricks of endurance high
Seeming to ponder ravages of time
That sacked the riches of its prime
when enchanting a kingdom was Sigiriya

The surrounding edifices summit palace
Other artful constructions that gave solace
To Kashyapa the patricide king
Swept away are they in the unmaking
By hand of time destroyed oh! Sigiriya

But there remains still to see
As if receiving from time clemency
The piece of art Sigiriya's pride
Painted in the cave of the rock side
The world famous frescos of Sigiriya

Bear breasted beauties holding flowers
Do they represent kings many lovers
Also seen as beauty idols for ever
Winning beauty lovers world over
Those shapely painted women of Sigiriya

Then there is the mirror wall
Remaining shiny after all
Defacing by man and elements
Standing along lead to the entrant
Of the majestic lion's mouth of Sigiriya

From the commanding lovely view
If the king in palace could receive
Feelings of saefty and ramance
Did howling winds wishper vengence
In the decade of Kashyapa in Sigiriya

The tiny decade belongs to our history
Given to treachery, treason valour, victory
Truly great works of manual feats.
Agriculture and architectural terats
Such heritages founded enriched Sigiriya

What time will unfold develop bloom
Later destroys sweeps away with its broom
Lost are in the time's refuse bin
Secret paths skills devices used in
The little but amazing kingdom of Sigiriya

**W. D. A. Raymend** -(554)
**(written in 1991 after a visit)**
**0112 231357**



# ඉඟිය....

දවසින් දවස ගත සිත සවි — ගිලිහෙද්දී
මනසින් විඳින ලෙඩ දුක් ටික ටික — එද්දී
හරසුන් බවක ගොළු කුටියක තනි — වෙද්දී
දරුවන් වගේ වෙනවලු වයසට — යද්දී

එකලදී තිබුණ කඩිසරකම් හැම — දේටත්
මෙකලදී නිරස වී දත් නියවයි — ඊටත්
උදයෙදී මෙන්ම හුරු විය යුතු වෙයි — රෑටත්
කලකදී දැනෙයි අසරණ බව කොයි — කාටත්

කාසිය හැරෙන අත ඇත නෙත — යොමාගෙන
නැසිය කමත් මුදලට — ආවඩාගෙන
වාසිය සොයා ඇයි උනුනුන් — මරාගෙන
ආ අය වෙලත් එක බඩවැල — කඩාගෙන

කුඩු කේඩුකම් ගිනිගත් හද දැරිය — නොහේ
දඬු දික් කරාගෙන හැම මිනිහෙකුම — රෑහේ
අඩු කම් දැනේනම් මෙහෙ වාගෙමත් — එහේ
බඩු පොදි ගසාගෙන තව යන්නටද — කොහේ

අත හිත දුන්නෙ ගන්නට නොව දෙයක් — නෙලා
ඇඳිවත තියාගෙන කළයුතු හරිය — කළා
අනියත දහම හැමටම දෙන ඉඟිය — බලා
මුනිවත රකිනවද ? දොරකඩ ළඟට — වෙලා



- ජේමදාස අතාවුද - (3146)
077 - 3410528
011-2928944

# උඹ එන තුරා....

''වළලු නැති අතකින් උයන බත් රහ නැතිලු'' මෙය රජරට ගොවීන් අතර පවත්නා කතාවකි. ඔවුන්ට ගැහැණියක් අතින් ඉදුණු බතක රහ බැලීමට අවස්ථාවක් නොලැබෙන වග කියන සැටිය මේ. වරෙක මනාලියක් කැඳවාගෙන ඒම සඳහා හේනක කුඩා නිවසක් පිළිසකර කරන තරුණයෙකු අපට හමුවිය. ඔහු හෙළිකළ ඔහුගේ ආදර කතාවේ රස බිඳකි මේ.


බඹරුන් රැන බක් මී මල — වටේමය
මී මැසි රැන උන් බැඳි මී — වටේමය
ගිරවුන් රැන වැපුරු කෙත — වටේමය
බාලේ පටන් මගෙ හිත නුඹ — වටේමය

කන්දට උඩින් ඉර පායා ගෙන — එද්දිත්
බැද්දට උඩින් සඳ පායා ගෙන — එද්දිත්
වට කොට හේන දඬු වැට ඉදි — කරද්දිත්
මගෙ හිත නුඹ ළඟයි දුරකින් — සිටිද්දිත්

ඉර බැස ගියත් මගෙ හේනට — කළුවරය
සඳ බැස ගියත් මගෙ හේනට — කළුවරය
ඉර හඳ පැව්වත් කොහොමත් — කළුවරය
උඹ එන තුරුම මගෙ හේනට — කළුවරය

බඹරුන් තලයි බැද්දේ එන මල් — කැකුලු
නෑනෝ ගෙට වෙයන් කෙරුවා ඇති — මුකුලු
රහ නැහැ බත් උයන අතකින් නැති — වළලු
උයපං බතක් දාගෙන දැතෙම — වළලු

ටී. ඒ. ජී. ගෝමිස්
(624)
011 2926374.



# අනිත්‍ය දුටිමි

සිසිල් සුළං රැලි ගතපුරා දැවටෙයි. සෙමෙන් සෙමෙන් සැඳෑ අඳුර අවට වෙලා ගනිමින් සිටී. අහසේ දිලෙන්නට වෙර දරණ චන්ද්‍රයා ඈත අහස් කුසයෙන් එබී බලයි. මම සඳ දෙස බලා සිටියෙමි. ලස්සනට මුළු ගෙවත්ත පුරාම සඳ එළිය පැතිර ඇත. ඇට්ටේරියා ගස මලින් බර වෙලා. ලස්සනට පිපුන ඇට්ටේරියා මල් මත සඳ එළිය පැතිරිලා ඒ මල් සියල්ල ආලෝකයෙන් වසාගෙන ඇති සැටි. නිසල අහසේ වවුලන් රැනක් පියාසර කරමින් සිටී. ඇට්ටේරියා මල් සුවඳින් ගත සිත පිනා යයි. මුළු ගෙවත්ත පුරාම ඒ මල් සුවඳ පැතිරිලා යන සැටි කදිමයි. සඳ එළිය නිසා පොළොව මත සටහන් වෙලා ඇත්තේ රූප සටහන් ලෙසට. මම මල් සුවඳ විඳිමින් ගෙවත්තේ සැහෙන වේලාවක් සිටියෙමි.

ගෙදර බුදු පිළිමය ඉදිරිපස දැල්වෙන පහනේ පහන් සිල සුළඟින් නටයි. සුදු ඇට්ටේරියා මල් වලින් පිරුණු මල් වට්ටිය ඒ අසල ඇත. ඒ දසුන පහන් ආලෝකය නිසා මනාව දර්ශනය වේ. පසෙකින් දැල්වෙන හඳුන්කූරු සුවඳ ගෙතුළ සහ අවට පැතිර යමින් පවතී. සේපාලිකා ගසත් මල් වලින් පිරිල. හරිම පිවිතුරුය. සේපාලිකා මල් මත ද සඳ එළිය වැටීම නිසා දිලිසෙයි.

මගේ බිරිඳ පන්සිල් පද කියන හඬ ගාථාවන් ගායනා කරන හඬ පැතිර පවතී. මම ද ඒ අසලින් වාඩි වී මල් පූජාවට සහභාගි වීමි. ඇය විසින් ගායනා කරන පිරිත් සජ්ඣායනාවට මම ද සහාය වීමි. පසු දින නිවාඩු දිනයකි. ඒ නිසා ටිකක් නිදා ගැනීමට හැකි විය. කුරුල්ලන්ගේ මිහිරි ගීත රාවයෙන් පරිසරය හැඩ ගැන්වී ඇත. මම සේපාලිකා ගස දෙසට සෙමෙන් සෙමෙන් පියවර මැන්නෙමි. සැන්දෑවේ පිපී තිබුණ මල්

බිම පතිත වෙලා. ගස වටේටම බිම මල් වලින් පිරිලා. තව මොහොතකින් හිරු පායනු ඇත. එවිට මේ මල් සියල්ල මැලවී යනු ඇත. එතන අනියත බව සැගවිලා. තව දින දෙක තුනකින් මේ මල් සේරම පොළොවට පස් වෙලා යාවි. අපගේ ජීවිතයත් මේ වගේමයි. පෙති ගිලිහිලා වැටිලා. බිම පතිත වෙලා. මේ මල් පෙතිත් අර වගේම වේලිලා යාවි.

අපි උදෑසන අවදි වෙනවා. වැඩ වැඩ ගෙදර දොර වැඩ. ඉවරයක් නැති වැඩ. බැංකුවට යන කාලේ පුදුම කලබලයක්. සමහර දාට ඉවුම් පිවුම් වැඩ බොහෝමයි. ඒ අතර සමහර දාට දිය නාන්නත් වෙනවා පහමාරට විතර. වතුර ඒ වේලාවට හරිම සීතලයි. මොහොතකින් අර සීතල නැති වේලා උණුසුම දැනෙන්ඩ පටන් ගන්නවා. සබන් ගානවා නානවා.

''රැවුල කැපුවෙත් නෑ නේද?''
''හැබෑට හැබෑට රැවුලත් කපන්න එපායැ''
දත් මදිනවා, රෙදි සෝදනවා, එහෙට දුවනවා මෙහෙට දුවනවා.
''වේලාව ඕ හැබෑට වෙලාව කීයද? දන්නේ නෑ''
''අප්පා හය හමාරත් පැනලනෙ''
''කමක් නෑ''
''පවුඩර් එක ආ මේ තියෙන්නෙ''
''ඇඳුම් මැදලද දන්නේ නෑ''
'' ආ මැදලා''
සිතට තරමක සහනයක්
භාර්යාව මේවා කලින්දා මැදලා තියන්න ඇති.
''දැන් කොහොමද හැඩද?''
''හරි හරි ජැන්ඩියට ඇදලා වගේ පේනවා''
''ඔව් ඔව් ලස්සනයි හැඩයි''
''කොණ්ඩෙ හැඩද?''
''හැඩ මදි වගෙ''
''බ්‍රිල් ක්‍රීම්, කෝ බ්‍රිල් ක්‍රීම් එක.''
''ආ මේ තියෙන්නේ''
''ටිකක් අතුල්ලලා දාමු''
ඒ කාලයේ ජීවිතය ඇත්තෙන්ම හරිම සුන්දරයි.
''බස් එක''

දැන් දුවන්නේ බස් එකට. බසය බොහොම මගීන්ගෙන් පිරිලා. මේ ඔක්කොම රාජකාරි සඳහා යන අයනෙ. බස් එකෙන් දුම්රියට. ගම්පහින් දුම්රියට ඇතුළු වීම හරිම අපහසුය. ඒ තරමටම මගීන්ගෙන් ස්ටේෂම පිරිල. සමහර උදවිය ජනෙල් මත නැගල. සමහරෙක් ජනෙල්වල එල්ලිලා. ගම්පහින් කොළඹ කොටුවට.කොටුවෙන් නැවත ගම්පහට. ගම්පහින් ගෙදරට. ජීවිතයත් ඔහේ ගෙවිලා යනව. දින ගණන් මාස ගණන් අවුරුදු ලෙසට ගෙවී යනව. කාලෙ දිගින් දිගටම ගෙවී ගෙවී යනව.

අපි දන්නෙම නැතිව කාලෙ ගෙවිල යනව. දැන් මේ විදියට කොපමණ නම් කාලයක් ගෙවිල ගියාද?
''දැන් කෝ අර ඒ කාලෙ තිබුණ පෙනුම''
'' පෙනුම වෙනස් වෙලා නේද?'

ලස්සනට රැලි වැටිල තිබුණ කෙස් වැටිය දැන් ඇදිල පැදිල වෙනස් වෙලා. කණ්ණාඩියෙන් මුහුණ දකින සෑම විටම මෙය මැනවින් පෙනේ.

''කෙස් වැටිය සුදු පාට වෙලා''
''ඒ කාලෙ කොණ්ඩෙ කළු කරල නේද''
''එහෙනම්''
''එතකොට කොණ්ඩෙ කොපමණ හැඩද?''
''දැන් කපුටු කූඩයක් වගෙනෙ''
''දත් දෙක තුනකුත් ගැලවිල.''

රූපයත් වෙනස් වීම් වලට පත්වෙල ඇදිල පැදිල ගිහිල්ලා. ඇස් පෙනීම කන් ඇසීමත් දුබල වෙල. වෙනද වගේ නෙවෙ ටික ටික ලෙඩ රෝගත් එනව වගෙ.

ගෙමිදුලේ වැවී ඇති රෝස පඳුරේ මල් පිරිල. කවුද මේ රෝස අත්ත දුන්නෙ. කවුදෝ මිතුරෙකුගෙන් ලැබෙන්න ඇති. ඒ කවුදැයි කියා දැන් මතකයක් නැත. තවත් දින දෙකකින් නැත්නම් තුනකින් මේ මල් මැලවිලා යාවී. පෙති එක  දෙක පොළොවට පස් වෙලා යන සැටි.

මගේ අත් පා වල දැනෙන වේදනාව ද ටික ටික වැඩි වෙනව. මේ ඇට්ටේරියා ගසත් සේපාලිකා ගසත් තව ටික කලකින් දිරා විනාශ වී යනු ඇත. මගේ දිවිය ද තව නොබෝ දිනකින් අවසන් වී යනු නියතය.


''සබ්බේ සංඛාරා අනිච්ඡා''

බුදු පියාණන් වහන්සේ මෙසේ වදාළ සේක. මෙලොව හටගත් සියල්ල කවදා හෝ විනාශ වී යනු ඇත. බුදු පියාණන් වහන්සේ ඇතුළු සියළුම බුදු පසේ බුදු රහතන්වහන්සේලා ද පිරිනිවන් පා ඇත. උන්වහන්සේලා ද මේ දිරන ජරාවට පත්වන ස්වභාවයට පත්වී ඇත. බුද්ධ ශරීරය ද අළු ගොඩක් ධාතු ගොඩක් බවට පත්විය.

එවකට පැවැති ලක්දිව සියලු වෙහෙර විහාර ද අද වන විට නටබුන් වී ඇත. එය අපට අනුරාධපුරය, පොළොන්නරුව වැනි සිද්ධස්ථාන නැරඹීමේදී මනාව වටහා ගත හැකිය. එවකට පැවැති රජමාලිගා වැනි ස්ථාන වල ද නටඹුන් අපට දැක ගත හැකිය. සීගිරිය වැනි ස්ථාන මෙයට කදිම නිදසුන්ය. මේ ආදී සියලු දෙයින්ම මෙලොව ඇති අනියත බව අපට කියා දී ඇත.

ඇතිවීම පැවතීම, ජරාවට පත්වීම පමණියි ඉතිරිව ඇත්තෙ. අපගේ සිරුර පාලනය කරනු ලබන්නේ චිත්ත චෛතසික ධර්මතාවයන් විසිනි. සිත් 89 ක් සහ චෛතසික ධර්මයන් 52 ක් විසිනි. මේ ශරීර කූඩුව නැමැති රූප 28 හසුරුවන්නේද ඉහත සඳහන් කළ චිත්ත චෛතසිකයන්ය. යන්නෙ එන්නෙ ඇවිදින්නෙ වාඩිවෙන්නේ කෑම බීම ගන්නේ මේ සියල්ලට අනුබලය සඳහා වාත වේගය ලබා දෙනුයේ ද  අර චිත්ත චෛතසිකයෝමය.

අවසාන වශයෙන් අපගේ චුති සිත නිරුද්ධ වීමෙන් අපේ ජීවිතය කෙලවර වේ. ශරීරය ද දිරා බිඳී සුන් වී යනු ඇත. ඉන්පසු අළු දූවිලි පරමාණු නියෝට්‍රෝන් වැනි ඉතා සියුම් අවස්ථාවනට පත්වේ. ඒ පියවි ඇසට නොපෙනෙන දූවිලිය.



**ආර්. පී. ඒ. ගුණසේකර (758)**
**033 2224662**

## අපේ පිටුව

අපේ පිටුව අපේ පිටුව අපේ පිටුව



ශ්‍රී ලංකා අධ්‍යාපන ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර (SSC) විභාගය පැවැති වකවානුවක් විය. එමෙන්ම එම විභාග නාමය වෙනස් වී අ. පො. ස. ප.(සාමාන්‍ය පෙළ) - (GCE - O/L) බවට පරිවර්තනය වේ. ඔහු ඒ විභාග දෙකටම පෙනී සිට සමත්වේ. ඔහුගේ ප්‍රාථමික අධ්‍යාපනය කල එළි වුයේ මාතර රාහුල, තංගල්ලේ ක්‍රිස්තුදේව, වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහල, දික්වැල්ල විජිත මධ්‍ය මහා විදුහල ආදී විද්‍යාල ඇසුරේදීය. සරසවි පිවිසුම හෙවත් උසස් පෙළ විභාගයට ආසන්නව සිටියදී ඔහු ශ්‍රී ලංකා මහ බැකුවට බැඳුනේය. ඒ 1962 වසරේ අගෝස්තු මාසයේදීය. එතැන් පටන් මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු 12ක පමණ හා ගුවන් තොටුපල රන් අලෙවිහලේ කළමනාකරු වශයෙන් ද කටයුතු කර ඇත. ඒ අතරතුර කොළඹ විශ්ව විද්‍යාලයේ සේවක අධ්‍යාපන පීඨයේ කළමණාකරණය හා සංවර්ධනය පිළිබඳ උපාධියද, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂි විද්‍යාලයෙන් පශ්චාත් උපාධියක්ද, සබරගමුව විශ්ව විද්‍යාලයෙන් ඉංග්‍රිසි හා පරිපාලනය පිළිබඳ උපාධියක්ද නෙදර්ලන්තයේ වාගිනින්ගන්, සෝවියට් දේශය් ටෂ්කන්ට්, ඉන්දියාවේ බැංගලෝර්, බොම්බායේ පුනේ, හයිද්‍රාබාද් උසස් අධ්‍යාපන ආයතන වලින් අභිඥාපත්‍ර ද ලබා ඇත.

මහ බැංකු සංස්කෘතික සංගමයේ ක්‍රියාකාරිකයෙකු වූ ඔහු කලක් එම සංගමයේ උල්පත සඟරාවේ සංස්කාරක විය. 1981 දී ජාතික රූපවාහිණියේ ප්‍රවෘත්ති ප්‍රකාශකයෙකු ද විය. තවද සිංහල හා ඉංග්‍රීසි පුවත් පත් වලට ලිපි සපයන ලේඛකයෙක් ද විය. ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන පාලන සමයේදී එතුමාගේ ඉල්ලීම පරිදි එක්තරා අවස්ථාවකදී බ්‍රිතාන්‍ය තානාපති ග්ලැස්ටන් මහතාගේ හා ජපන් තානාපතිතුමාගේ කථාවන් සිංහලට පරිවර්තනය කිරීමේ කාර්යය පැවරුනේ නිවේදන කටයුතු වල යෙදී සිටි ඔහුටමය. ඔහු එය මැනවින් ඉටු කළ බව ජනාධිපතිතුමා ප්‍රකාශ කලේ ප්‍රශංසාත්මකවය. ඉන් අනතුරුව ටික කලක් සංචාරක මණ්ඩලයේ උප සභාපති වශයෙන් කටයුතු කළ ඔහු සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමට කැප වූවේය. මෙසේ විවිධ ක්ෂේත්‍රයන් තුළ කැපී පෙනෙන හා ආකර්ශනීය දක්ෂතාවයන් පෙන්වූ ඔහු වෘත්තීය සමිති කටයුතු වල ද නිරත විය. එමගින් රැකියා තහනමට පවා ලක් වී ඇත. එවකට වෘත්තීය සමිති ක්‍රියාකාරීකයන් වන ටී. අන්ද්‍රාදි, චන්ද්‍රසේන වෙදගේ, ඒ. පී. සිරිපාල, පේමදාස අබේධීර ගුණරත්න, වර්ෂහැන්නැදිගේ පියදාස ආදීන් පිළිබඳව සඳහන් කරන්නේ සහෝදරාත්මකවය.


මෙවන් විවිධ කුශලාතාවයන් හා කැප කිරීම් සැලකිල්ලට ගනිමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් අන්තර් ජාතික විවෘත විශ්ව විද්‍යාලයෙන් ආචාර්ය උපාධියක් ද ඔහුට පිරි නැමීය. ඔහු සමග එම සම්මාන ආචාර්ය උපාධි ලද්දෝ 40ක් වූහ.

විටෙක නිවේදකයෙක් ද, විටෙක ලේඛකයෙක් ද, තවත් විටෙක වෘත්තිය සමිති ක්‍රියාකාරිකයෙක් ද, හස රස කථාකරුවෙක් ද, වූ ඔහු වනාහි අන් කවරෙකුවත් නොව ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයෙකු වන **ආචාර්ය ධර්මසේන වැලිගම** නම් වන්නේය.

**(2015-04-02 වැනි දින හදිසියේ අභාවප්‍රාප්ත වූ ආචාර්ය ධර්මසේන වැලිගම සොහොයුරාණන්ට මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ ගෞරවනීය උත්තමාචාරය මෙසේ පිරිනැමෙන වගයි.....** )

# එදායින් මෙදාටත්......





**ආරියදාස තන්තිරිගේ (3805)**
**0112 811049/ 077 3566345**

සමාජ සංස්ථාව තුළ විවිධ ආයතන මෙන්ම විවිධ සේවාවන් නිර්මාණය වෙලා තියෙනවා. ඒ වගේම ඒ ආයතන හා සේවාවන් සමාජ පෙරටුගාමී උපකරණ විශේෂයක් හැටියට සමාජගත වීමත් සිදුවෙලා තියෙනවා. ඒ බව පේන්නත් තියෙනවා. මේ සෑම ආයතනයකට ම වෙන්වූ හා නියම වූ විශේෂ වැඩ කොටසක් නියමිතයි. ඒ වැඩ කොටස නිසා රැකියාවල් කිහිපයක් බිහි වෙලා. ඒ ඒ රැකියාව හෙවත් සේවාව මූලික වෘත්තීය සුදුසුකම් පෙළක් සපුරාලිය යුතුයි. සුදුසුකම් නැති නම් ඒ ඒ වෘත්තීන්ට නුසුදුසුයි. නුසුදුසු අය ඒ ඒ වෘත්තීන්ට බඳවා ගන්නෙත් නැහැ. සුදුසුකම් නැතිව කිසියම් වෘත්තියකට බඳවා ගැනීම අනිවාර්යයෙන්ම සාදාචාර විරෝධියි. එහෙම සදාචාර විරෝධී විධියට කිසියම් වෘත්තියකට ඇතුළු වුනොත් අදාල වෘත්තියේ කාර්ය භාරය කෙරෙන්නෙත් නැහැ. ඒක සමාජයට පාඩුවක්. සමාජ දේහය අංගවිකල වීමක්. මානව සංහතියට රික්තයක්. ඒ නිසා සමාජය වෙනුවෙනුත් නියම වී ඇති කාර්ය කොටස ඉටු කෙරෙන වෘත්තීය අගයන් නොනැසිය යුතුයි. ලොව පවතින සෑම වෘත්තියක් සඳහාම අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතුයි. එහෙම නොවී '**බලය**' යොදා ගනිමින්, චන්ඩිකමින් තර්ජනයෙන්, ඥාතීත්වයෙන්, දැනහැඳුනුමෙන්, මුඛරිකමෙන්, වචාලකමින්, මුසාවෙන්, වංචාවෙන්, ප්‍රෝඩාවෙන්, අවනීතියෙන්, කූට ලේඛන මගින් හෝ සමාජයේ වෘත්තීය කාර්ය භාරයකට අනුගත වීම සහසුද්දෙන්ම සමාජ විරෝධියි.මානව විරෝධියි. සදාචාර විරෝධියි.

මිනිසා විසින් නීති ජාලයක් සකස්කර ගත්තේත්, විටින් විට එය ප්‍රගතිශීලි ලෙස ප්‍රතිංසංස්කරණය කර ගත්තෙත්, ඊට ගරු කරන්නෙත්, හිස නමන්නේත් ඒ මගින් සමස්ථ සමාජයට ම කෙරෙන උත්තුංග යහපත නිසාවෙනි. නිතිගරුක පුද්ගලයා සමාජයට සම්පතක් වශයෙන් හැදින්විය හැක්කේ එබැවිනි. නිතීගරුක පුරවැසියා රහසින්වත් නිතීය කඩකරන්නේ නැහැ. කඩකරන්නට උඩ ගෙඩි දෙන්නෙත් නැහැ. යමෙකු නිතීය කඩ කරන විට හෝ නිතීය අවනිතීයක් බවට පත්කරන බව පෙනෙන විට හෝ නුදුටු ඇස් ඇතිව. නෑහුනු කන් ඇතිව සිටින්නේ ද නැත.

දකුණු ආසියාවේ බොහෝ රාජ්‍යයන් හි පවතින පිළිගත් නිතී ජාලය, බොහෝවිට දේශපාලන බලධාරීන් කිලිටි කරන ලද බවට මෑත කාලීන නිදසුන් ඉතිහාසය තුළ ඕනෑවටත් වඩා ඇති බව රහසක් නොවෙයි. 'බලය දූෂණය කැඳවයි. වැඩි බලය වැඩි දූෂණය කැඳවයි'. යනුවෙන් ඇක්ටන් සාමිගේ ප්‍රකට කියමන පොත පතට පමණක් සීමා වී ඇති යුගයක් ගෙවෙමින් පවතිනවා.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය භාරය සඳහා බඳවා ගැනුනේ ද ඊටම අදාල සුදුසුකම් වල උපරි ව්‍යුහයෙනි. එමෙන්ම ඔවුහු උපරිම අයුරින්ම සිය වෘත්තියට අදාල කාර්ය භාරය ඉටු කරන්නෝ වූහ. මුදල් නීතී පනතටත්, ආයතන සංග්‍රහයටත් අනුකූලව. එම නිතී රීතී සුරකිමින් රාජකාරිය දේවකාරිය ලෙස සලකා කටයුතු කළෝය. ඒ අතරතුර කාලාතුරකින් අත්වැරද්දක් මගින් දෝෂයක් සිදු වූ අවස්ථා නැතුවා නොවේ. ඒත් එබඳු අවස්ථා වලදී ද ආයතන සංග්‍රහයේ නිතීරීතී වලට අනුකූලව බැංකු අත්පොතේ විධිවිධානයන්ට අනුගතව විනය පරීක්ෂණ පවත්වා වැරදි කරුවන්ට දඬුවම් දුන් අවස්ථා එමටයි. ඉන් පැහැදිලි වන්නේ ආයතන නිතී රීති බිහි වී ඇත්තේ ආයතනයේත් ජනසමාජයේත් යහපතම කේන්ද්‍ර කරගෙන බවයි.

ආරම්භක යුගයේ බැංකු අත්පොතේ ම සඳහන් කරල තිබුනලු 'බැංකුවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකුට කාගේවත් විදේශගමන් බල පත්‍රයකට, ණයකරයකට, වත්කමකට, ඇප විදියට හෝ සහතිකකරන පුද්ගලයෙක් හැටියට හෝ අත්සන් නිකුත් කරන්න හෝ සහතික නිකුත් කරන්න එපා කියලා. ඒක නුසුදුසු නිතී විරෝධි, ක්‍රියාවක් විධියටයි සඳහන් කරල තියෙන්නෙ.

ඒ වගේම වෙනත් බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් හෝ කල්බදු සමාගමකින් ණය මුදල් ලබා ගැනීමට 'මහ බැංකුවේ' කාර්ය මණ්ඩලයේ නිළධාරියෙකුට අවසරයක් නැත. මෙබඳු නිතී හා අණපනත් පැවැතියේ ආයතනයේ ස්වාධිනත්වය කීර්තිනාමය, අද්විතිය බව ආරක්ෂා කර ගැනිමේ අදහසින් විය හැක. එහෙත් මුලදී සඳහන් කලාක් මෙන් අත්වැරද්දකින් හෝ නොදැනුවත්කමින් හෝ සිතාමතාම හෝ එවැනි ගනුදෙනු සිදු වූ අවස්ථා ඇත. එවන් අවස්ථා වලදී වෘත්තීය සමිති ක්‍රියාකාරිකයන්ගෙන් ඉදිරිපත් කෙරුණු කරුණු දැක්වීම් හා හේතු සාධක නිසා එබඳු අනම්‍යශීලි රෙගුලාසි, ලිහිල් වී නම්‍යශීලී කර ගන්නා ලදී. එහිදි බැංකු අත්පොතට ලිඛිත අවසරයකින් තොරව යන සංශෝධනය එකතු කරන ලදී. ඉන් පසුව මහ බැංකුවේ **'ලිඛිත අවසරයකින් පසුව'** බාහිර ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීමට මහ බැංකු නිළධාරීන්ට අවස්ථාව උදා විය.

අතීතයේ එබඳු විධිමත් හා නිත්‍යානුකූළ සංශෝධන මගින් ලද සහනයන් රාශියක් අද මහ බැංකු ජ්‍යෙෂ්ඨයන් මෙන්ම වර්තමානිකයන්ද භුක්ති විදින බව සැබැවකි. මෙහිදී ඒ වෙනුවෙන් කැප වූ එම්. තංගයියා, ටී. අන්‍රාදි එච්.එම්.බී. හේරත්, ඩග්ලස් සිල්වා ඔස්ටින් මිහිඳුකුල සූරිය හා මෑතකදි අභාවප්‍රාප්ත වූ ලෙස්ලි රණසිංහ ආදී මහත්වරුන්ගේ කැප කිරීම් හා විචක්ෂණශීලී කරුණු දැක්වීම අගේ කළ යුතුවේ.

## මතකයට පුසුඹ පළමු පෙම ගැන කාව්‍ය සංවාදය.......



# කවි මඩුව



## කවි මඩුව

අවුරුදු උදා කළ පසුගිය        'සැඳෑවේ'
කවි මඩුවකට ගෙන ආ        යෝජනාවේ
කාලෝචිත බවට අටුවා අවැසි        නොවේ
කවියෝ 'සැඳෑවේ' එහි        හමුවුනාවේ

කවි ගුරු මගේ අමරෙගෙ ඇරයුම        පරිදී
මම කවි ලියන්නම් කවි මඩුවකට        වැදී
කවදත් කලාවට කවියට හොඳට        ලැදී
සුමිතුරු ලාල් මෙය සැලසුම් කරන        ලදී

දෛවය විසින් මට හිමි කළ තුරුණු        බිම
හටගත් වැලේ මල් පිපිණා හැම        තැනම
වියපත් වෙලා හැත්තෑවස් ගිය        ඉක්ම
මට දැන් මතක නැහැ කොයික ද        ''පළමු පෙම''

අරඹනු පිණිස සංවාදය කවි        මඩුවේ
''ප්‍රේමය පළමු'' වැනි සිරසක් ඇයි        යෙදුවේ
අමරේ සකසු ලොකු වරදකි මේ        කෙරුවේ
ලෝකයෙ කවුද ඒ ගැන ඇත්තක්        කිව්වේ

ජීවන මගේ ආපසු පිය        නගන්නෙමි
කොයිකද 'පළමු පෙම ' විමසා        බලන්නෙමි
ඉන්පසු 'සැඳෑවට' තොරතුරු        ලියන්නෙමි
කවි මඩුවට මගේ ආසිරි        පතන්නෙමි

**ගෝමි (624)**
**2 926374**




## නන්දනීය ප්‍රථම පෙම

වින්ද දිවා දාහය ගෙවෙමින් යද්        දී
බැන්ද කිතුල්මල වට හිත දැවටෙද්        දී
කන්ද උඩින් හැන්දෑ කළුවර එද්        දී
නින්ද එපා මුල් පෙම සිහියට එද්        දී

කර දඬු ඉහළ යන කළ දෙගුරුන් සෙව        නේ
පෙර මුණ සිප්සතර වෙනුවෙනි කැප කෙරු        නේ
තරගෙට නෙමෙයි කොලුකමටයි දඟ කෙරු        නේ
හුරතල් සිනා පොද එහිදියි බිම හැලු        නේ

කවදත් කැමැත්තෙනි අකුරට ආවේ        ගියේ
පැණවත් ගුරුතුමන් සෙවනේ සුවය        තියේ
හරවත් යමක් පාඩම් පොත් අතර        තියේ
තවමත් රහට ගැයු කවි ගී මතක        තියේ

පංතිය කෙළවරේ දිගැ'සිය විමසිල්        ලේ
හැංගෙන හැඟුම් පැද්දෙනු මෙනි ඔන්චිල්        ලේ
ශෘංගාරයට රහ වැටුනම සිතුවිල්        ලේ
පෙම්පත පාට කෙරුනේ ලද ඇසිල්        ලේ

හිමිදිරි පාන්දර ඇය අකුරට        ආවා
වටපිට බලා රහසින් ඉඟියක්        පෑවා
පොත තුළ දමා කිසිවක් ඇති බව        කීවා
පෙම්පත් නොවේ පොඩි රස කෑමක්        වූවා

දෙව් දුන්නට වඩා නෙතගේ බැල්ම        හැඩයි
දාහක් වචනයට වැඩියෙන් ඉඟිය        සරුයි
සත්සර අම්හිරියි ඇගෙ හඬ අමා        රසයි
ඔක්කොම ''ප්‍රථම ප්‍රේමය'' සතු ගුණා'        ගුණයි

ගතවිය කාල ගුරුගෙය එහෙ මෙහෙ        වූවා
උතුර - දකුණ දෙස සිවු නෙත් දුර        වූවා
දයා'දර මතක මරණය තෙක්        වේවා
නන්දනීය පෙම මතකය සතු        වූවා

බැල්ම        ශෘංගාරමය
ඉඟිය        සංකූලමය
රසය        තුන්කාලමය
සිතට        සංතෝසමය



**අමරපාල කරසිංහ ආරච්චි (1230)**
**(078 5863155)**

# පළමු පෙම



මිහිරියි පළමු පෙම නොකිලිටි සිතකට බැන්ද
රිදුමයි හිතට බොඳවී පැතුම් කඳුලක් ඇන්ද
වෙන්වී ගියත් නොමවී ආරයෙන් අන්ද
තාමත් හිතතුලට ඉදහිට එබුනුය මන්ද ?

සොදුරුයි පළමු පෙම කදුලක රස දැනුනානම්
මිහිරියි වදන් වැල් ඉන් සවනක පිරුණානම්
ආදරයක් හැමදිනම ලෙංගතුවම ලැබුනානම්
ජීවිතයේ සතුට හැමදා ලඟ සිටියානම්

හිතතුල තබාගෙන තනිවම ආදර හැඟුම්
ඔහු / ඇය ඒ බවත් නොදැනම සිටියා නම්
නොලැබුන පෙමට හිත පතුලක රැදුනා නම්
මට ඔබේම වූ ඔබේම ආදරයක් තිබුනා නම්

පිවිතුරු පළමු පෙම
ලෙන්ගතුද කෙතරම්
නොබිඳුනේ නම්
බාධක අතර දැවටී

සොඳුරු හැඟුමන් හිතට එක්කර
නොසිතු මොහොතක දුකම ලංකර
වේදනාවන් ලයට තුරුලු කර
වෙන්වුනා අප නාඳුනන ලෙසා



**ජගත් කාරියවසම් (1215)**
**038 - 2236643**
**077 - 9507184**

# Values of Life

Keep your life void of
doubt and suspicion
Observe judge and act instantly
Reject instances that will lead
to you astray
Remain aware, be dedicate
to your duties
Set Examples not think of prestige
Be serious in life nothing comes easily
Morals and principles must be
the essence of a respectable life.
Attitudes of discernment leads to
quick and true insight
Take care of problems within problems
Good, will remain cherished bad will perish
Make your life a model,
helping others to follow.



**F.R. Irugakbandara.**

**(141)**

# අසිරිමත් පොළොන්නරු පුරවරයේ තෙදිනක්....

**මී**ට වසර ගණනාවකට පෙර නව යොවුන් වියේ මහ බැංකුවට පැමිණි අපි, දිවි මගේ දිගු දුරක් පියමන් කර, ජීවිතයේ සැඳෑ සමයේ විශ්‍රාමික දිවියකට එළඹ සිටිමු. අද මෙන් අලංකාර පුරවරයක් නොවුව ද, එදා ගම් දනව්වල සිට පැමිණි අපට අගනුවර මනරම් පුරවරයක්ම විය. එදා සිටි බොහෝ ඇසූපිරූ තැන් ඇති අය සමග ඇසුර ද මහ බැංකුවේ පැවති මහේශාක්‍ය බව ද අපව සාඩම්බර, ගෞරවණීය පුරවැසියන් බවට පත් කිරීමට සමත් විය. අප රටේ වාසනාවන්තම විශ්‍රාමික පිරිස අප යැයි මට සිතේ. මහ බැංකුවේ සේවය කළ කාලයේ මෙන්ම අදටත් අපි ඒ හිතමිතුරු ඇසුරේ ගැවසෙමින් සතුට, කඳුල, හුවමාරු කර ගනිමින් සුවසේ පසුවන්නෙමු. ඒ සඳහා අපව මෙහෙයවන 'සංගම්' දෙකක්ම අපට ඇත. VRS සංගමය මෙන්ම විශ්‍රාමික සංගමය ද අපට එකම නිවහනක් වැනිය. එකම පවුලක දරු පිරිසක් මෙන් සෙනෙහසින් බැඳී සුහද හමු වල දී එක් වෙමින්, විදෙස් සංචාර වල යෙදිමින් අපේ විවේකී විශ්‍රාම දිවිය වඩාත් එලදායි, හරවත් සහ රසවත් අයුරින් ගත කරන්නට අපට හැකි වී ඇත.

අපේ අලුත්ම සංචාරය 2015 මාර්තු 6,7,8 යන දිනවල සිදු විය. ඔබ ද ඊට එක් වුවා නම්, එහි රසවත් මතක සුවඳ ඔබට මේ දැන් පවා දැනෙනු ඇත. හය වැනි සිකුරාදා හිමිදිරියේ කොළඹින් පිටත් වූ අප උදේ තේ පානය සඳහා නැවතුනේ අඹේපුස්ස අවන් හලේදීය. ඉන්පසුව අලව්ව, පොල්ලහවෙල, කුරුණෑගල පසුකරමින් ගමන් කරද්දී කිසිදු පාලුවක් නොදැනුනෙ නිරතුරුව ඇසුනු මියුරු සංගීත සහ ගීත ගායනා නිසයි. අද අපට නිතර නොඇසෙන අපූරු ගීත රැසක් අපේ මිතුරු මිතුරියෝ මිහිරට ගායනා කළහ.

හබරණ 'අස්නාරා' හෝටලය වෙත ලඟා වෙද්දී එතරම් දුරක් පැමිණි බවවත් අපට නොදැනුණු තරම් සංගීතයෙන් ප්‍රමෝදයට පත්ව සිටියෙමු. දිවා ආහාරයෙන් පසු මඳ විවේකයක් ද ලබා ගෙන අප ගමන් අරැඹුවේ පොලොන්නරුව වෙතයි. වෙනදා පැවති වියළි දේශගුණය වෙනුවට නිල් පැහැ තුරු ලතා මඩුලු සහ සිහිල් දිය පිරි ඉතිරි යමින් තිබූ වැව් ගංගා මැදින් සැඳෑ සමය උදා වෙද්දී අපි අපේ ගමනාන්තයට ලඟා විමු. 'මහ නුගේ' හෝටල සහ 'ද විලේජ්' හෝටලය අප සඳහා වෙන් කර තිබුණි. සොබාදහමේ අසිරිය සිහියට නංවන අයුරින් එම හෝටල දෙකෙහිම වටපිටාව විසල් තුරු වියන් වලින් ගැවසී තිබුණි. සැඳෑ සිසිලත් සමග ඒ තුරු සෙවණ යට මඳක් ගිමන් හැර උණුසුම් තේ කෝප්පයක් රස විඳිමෙන් පසුව අපි අපේ කාමර තෝරාගන හෝරා කිහිපයක් විවේකයෙන් ගත කළෙමු. පිටතින් ඇසුණ සංගීත නාදය අපව කාමරයෙන් එළියට කැඳවීමට සමත් වූ අතර එතැන් සිට ඇරඹුණු සංගීත සන්ධ්‍යාව මහත් සතුටක් සැහැල්ලුවක් අප තුළ ඇති කළේය. රාත්‍රී භෝජනය හමාර වීමෙන් පසුව ද කලින් හමු වූ මිතුරු ඇසුරේ රසමුසු කතා බහ මැද රැය මැදියම ගෙවීයන වග ද අපට නොදැනුණි.

පසු දින පහන් වූයේ ද අපට සුන්දර මතක සටහන් රැසක් එකතු කරමින්ය. උදෑසන තේ පානයෙන් පසුව අපි 'පාසිකුඩා' වෙරළ තීරය බලා පිටත් වීමු. අප උපන් සුන්දර මව්බිමේ කොයි ඉසව්වක වුවද සොබාදහමේ අසිරියෙන් නම් අඩුවක් නැතැයි සිතුණේ පාසිකුඩා වෙරළ තීරයට පය තැබූ විටය. ඈත සිතිජය තෙක් විහිදුන නිල් දිය දහර, සුදු පෙණ බුබුළු රැගෙන වෙරළට දිවඑන සුසුදු රැලි පෙළ මෙන්ම රිදීවන් වැලි තලය ද උදා ළා හිරු රැසින් නැහැවෙමින් අපූරු සුන්දරත්වයක් මවා තිබුණි. ඒ සොඳුරු බවින් වශී වු ලෙසින් පැමිණි සියල්ලන්ම පාහේ ඒ සිසිල් දියට බැස ගත සරතැස නිවාගත්හ.

එදින දිවා ආහාරය ද වෙරළෙහිම වූ ලා වේව්ස් හෝටලයේ සූදානම් කර තිබුණි. දිවා ආහාරයෙන් මඳ වේලාවකට පසු අප පිටත් වූයේ සෝමාවතී පුදබිම වෙතයි. මනාව නිමවා තිබූ මාවත් සහ පාලම් සෝමාවතී පුදබිම වෙත යාමේ දී තිබූ සියලු දුෂ්කරතා දුර කර තිබුණි. අපි ඉතා සුව පහසුවෙන් එම සෝමාවතී සෑ රදුන් වෙත සැපැත් විමු. මහත් අනුහස් ඇති පුදබිමක් ලෙසින් සියල්ලන් අතර ඉමහත් පූජනීයත්වයට පත් සෝමාවතී සෑරදුන් මෙන්ම ඒ අසල ශ්‍රී මහා බෝධින් වහන්සේ ද වැඳපුදා ගෙන අපි ආපසු නවාතැන් බලා පිටත් විමු.

ඒ වන විටත් සැදෑ අඳුර ගලා එමින් තිබුණත්, වටපිටාවේ තුරු සෙවනැලි අතර රැඳෙමින් අපි බොහෝ වේලා සුහද කතාබහක පසුවූවෙමු. එදින සංගීත සන්ධ්‍යාව පෙර දිනටත් වඩා වර්ණවත් වී තිබුණි. අපේ මිතුරු මිතුරියන් ගායනයට මෙන්ම වාදනයට සහ රංගනයටත් කොතරම් හපනුන් දැයි පසක් වූයේ ඒ මොහොතේදීය. එමෙන්ම අපේ සංචාරයට සහභාගී වී සිටි අපගේ හිතවතුන්ගේ දූදරුවෝ ද මිහිරි ගී රැසකින් ඒ සන්ධ්‍යාව ආලෝකමත් කළහ.

උදාවූ දිනය අපේ සංචාරයේ වැදගත්ම දිනයයි. අපි උදෑසනින්ම තේ පානය නිමවා පිටත් වූයේ පොලොන්නරුවේ අසිරිමත් ඓතිහාසික ස්ථාන නැරඹීමටයි. පොලොන්නරු පුරවරයම අපේ අතීත ශ්‍රී විභූතියේ මුදුන් මල් කඩක් බඳු යැයි හැඟෙනුයේ අඩියෙන් අඩිය දක්නට ලැබෙන අගනා පුරා වස්තු නිසයි. ගල් විහාරය ඒ අතරින් වඩාත් විශිෂ්ට නිර්මාණයකි. බුදු රජාණන් වහන්සේගේ හිටි පිළිමයක්, හිඳි පිළිමයක් හා සැතපෙන පිළිමයක් ද ඉතා විශාල අයුරින් නිර්මාණය කර තිබීම විශ්ම ජනකය. අක්කර ගණනාවක් පුරා විහිදී පැවති ගල් තලාවක්, කුලු ගෙඩියකින් නොව පන්හිඳකින් කැටයම් කලා සේ ඉතා සීරුවට මට සිලුටු ලෙස බුදු පිළිමයේ මහ කරුණාව, ප්‍රඥාව මෙන්ම උත්තරීතරභාවය ද පිළිබිඹු වන අයුරින් නිර්මාණ කර තිබූ අයුරු හිතාගන්නවත් බැරි තරම්ය. එසේම එහි වූ සැතපෙන පිළිමය බුදු රජාණන් වහන්සේගේ පිරිනිවන් මංචකය සනිටුහන් කරන්නක් බව කරුණු දහයක් ගෙන හැරපාමින් එහි සිටි මාර්ගෝපදේශකයකු පැහැදිලි කළේය. එය හිටපු පුරාවිදු කොමසාරිස් සෙනරත් පරණවිතාන සූරීන්ගේ මතය බව ද ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.

එමෙන්ම පොළොන්නරු යුගයේ රජවරුන්ගේ රාජසභාව, රජ මාලිගාව, වැරදිකරුවන්ට දඬුවම් නියම කළ අධිකරණ ශාලාව සහ රජ පවුලේ අයට ස්නානය කිරීම සඳහා වූ කුමාර පොකුණ භික්ෂූන් වහන්සේලාට ස්නානය කිරීම සඳහා වූ නෙළුම් පොකුණ ආදිය ද ජලය ගලා බැස යාමට සදා තිබූ ජලපවහන පද්ධතිය වැනි තැන් අපේ පැරණි නිර්මාණකරුවන් ගේ මාහැගි දක්ෂතා සිහි ගන්වයි.

එමෙන්ම වටදාගෙය, අටදාගෙය, හැටදාගෙය, නිස්සංක ලතා මණ්ඩපය, ගල්පොත සත්මහල් ප්‍රසාදය වැනි තැන්වල ඇති කලා නිර්මාණ, ශිලාලේඛන, පැයකින් හමාරකින් නොව දින ගණනාවක් නැවතී බලාගත යුතු යයි සිතුන වාර අපමණය. ඒවා එතරම් ම විශිෂ්ට නිර්මාණයන්ය. පොලොන්නරුවේ කිරි වෙහෙර ද තවත් සුවිශේෂී නිර්මාණයකි. එහි සලපතල මලුවේ සිට අඩි හතරක් පසුපසට ගියවිට එහි කොත් කැරැල්ල දැකගත හැකි වේ. එමෙන්ම එදා එම ස්ථූපය ඉදි කරන අවස්ථාවේ කිරි මව්වරුන් 25000 ක් දෙනා එහි කැඳවා කිරි හැන්ද බැගින් දොවා එම සිමෙන්ති බදාමයට එක්කර එම ස්ථූපයේ බදාම සකස් කළ බව එහි සිටි මග පෙන්වන මහතා ප්‍රකාශ කළේය. මෙවන් අසිරිමත් තැන් බොහොමයක් දැක බලා ගැනීමට අපි වාසනාවන්ත විමු. එමෙන්ම හාත්පස දක්නට ඇති විශාල ගල්වැටි - ගඩොල් බැමි - නටඹුන් බවට පත්ව ඇතත් ඒ සියල්ල නිහඬව අපට පවසන්නේ අතීතයේ පොලොන්නරු පුරවරය සෞභාග්‍යයෙන් සපිරි කලා නිර්මාණ රැසකින් සුසැදි මනරම් පුරවරයක් වූ බවයි. ඒ අතීත ශ්‍රී විභූතිය අනාගත පරපුරටත් දැකබලා ගත හැකිවනු පිණිස නිසි අයුරින් රැකවරණ සලකා ඒ ස්ථානවල ගෞරවණීය බව ආරක්ෂා කළ යුතුව ඇත. ඒ නටබුන් අතරින් අවදි වූ අතීත මතකයන් සිහිපත් කරමින් අපි ආපසු ගමන් ඇරඹීමු. එම දුර කතර ගෙවා ආපසු නිවහනට ලඟා වන විට රාත්‍රී මැදියමත් එළඹෙමින් තිබුණි. ගමන් විඩාවක් හෝ කිසිදු වෙහෙසක් නොදැනීම ගෙවී ගිය දෙතුන් දින පිළිබඳව සුන්දර මතක සුවඳ සමග තවත් කාලයක් සතුටින් ගත කිරීමට අපට හැකි වනු ඇත.

**- මාලනී විජේසේකර -**

# මහා සභා රැස්වීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම 2015 අප්‍රේල් 26 වැනි ඉරිදා දින පෙ. ව. 09.00 සිට ප. ව. 03.00 දක්වා රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ බැංකු කටයුතු අධ්‍යන කේන්ද්‍රයේ 'බැංකු විදු පියස' හිදී පැවැත්වෙනු ඇති බව සමස්ත සාමාජිකත්වයට මෙයින් නිවේදනය කෙරේ.


**සැඳෑව**

**சந்தாவ**

**ශ්‍රී ලංකා**
**මහ බැංකු විශ්‍රාමිකයන්ගේ**
**සංගමය**
**2015 මාර්තු/ අප්‍රේල්.**



වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com

අංක : QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.



**ගරු ලේකම්,**
**මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,**
**116/2/1B, බෝ සමිඳු මාවත, දොලේකනත්ත,**
**මහරගම පාර, පිළියන්දල.**



රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

**සැඳෑව - සංස්කරණය**
**අමරපාල කරසිංහ ආරච්චි විසිනි.**

Typesetting - **Graphicworld** - Panadura.
graphicworld.pan@yahoo.com
graphicworldit@gmail.com